05

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2017, Vol. 6 (I) 63-93pp
© The Author 2017
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# අනුරාධපුර රුවන්වැලි ස්තූපය ඉදිකිරීම හා එහි පසුකාලීන මැදිහත්වීම් පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්

ටිකිරි බණ්ඩාර විජේපාල[1]

## Abstract

Ruwanweli stupa is the most respected stupa at Anuradhapura, not only in the past but also in the present. In the written history, the Ruwanweli Stupa is considered the center of the oldest Maha Viharaya premises. The history of dealing with this main peculiarities is expected to be explained in three main sections as (I) Oldest Intervention History (II) Medieval Intervention History and (III) Near Present Intervention History. The main purpose of this investigation is to construct the Ruwanweli stupa and then focus on the long history of intervention. This essay was used by historical sources as well as archeological sources. Anuradhapura is the representation of several old largest stupas. In addition to the Ruwanweli stupa, the main attraction is Mirisawetiya Stupa, Abhayagiriya Stupa, Dakkhina stupa and Jethawana Stupa. The focus here is on the Ruwanweli stupa and it also focuses on historical interventions during the late 2000 years.

**Key Words**; Ruwanweli Stupa, Anuradhapura, Intervention History,

[1] *කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. 0718578188 tbwijepala@gmail.com*

## හැඳින්වීම

වර්තමානයේ අනුරාධපුරයේ පවත්නා මහා ස්තූප අතරින් අංගසම්පූර්ණ ලෙස සංරක්ෂණයට භාජනය වූ ස්තූපය රුවන්වැලි සෑයයි. මෙහි විශ්වීය ස්ථානගත වීම උතුරු අක්ෂාංශ $08^0 21'49"$ හා නැගෙනහිර දේශාංශ $80^0 23'49"$ යන ඛණ්ඩාංක තුළ පිහිටයි. වන්දනා බැතිමතුන්ගේ නිබඳ ගෞරවයට පාත්‍රව ඇති මෙහි වර්තමානයේ ආගමික කටයුතු විහාරවාසී භික්ෂූන්වහන්සේගේ මැදිහත් වීමෙන් සිදු වන අතර, පුරාවිද්‍යාත්මක කටයුතු සිදු වන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධීක්ෂණයෙනි.

අනුරාධපුරයේ රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් මැදිහත් වීමේ ප්‍රධාන අවස්තා දෙකක් ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී හඳුනා ගත හැකි ය. එනම්ල ස්තූපය ඉදිකිරීමේ අවස්තාව හා පසුකාලීනව එහි චිරස්ථිතිය වෙනුවෙන් ආරක්ෂණ මැදිහත් වීම් සිදුකිරීමේ අවස්තාව යි. මෙම දෙවන මැදිහත්වීමේ අවස්තාව ඉතා වැදගත් සේම ඉතා දීර්ඝකාලීන ක්‍රියාවලියක් බව ද පැහැදිලි ය. එය දේශීය මුහුණුවරින් මෙරට පාලකයන්ගේ හා විදේශීය රාජකීය නියෝජිතයන්ගේ මැදිහත්වීමෙන් සිදු වී තිබේ. රාජධානි අවධි මට්ටමින් අධ්‍යයනය කිරීමේ දී ස්තූප ඉදි වූ අනුරාධපුර අවධියේ පාලකයන්ම මේවායේ සුරක්ෂිතතාව වෙනුවෙන් මහත් සේ කැප වූ බව ද පෙන්වා දිය යුතුම ය.

අතීතයේ ස්තූප ඉදිකිරීම එක් පාලකයෙකු විසින් හෝ පාලකයන් කිහිප දෙනෙකුගේ මැදිහත් වීමෙන් සිදු වූ බව ඉතිහාස මූලාශ්‍ර මඟින් තහවුරු වෙයි. මේ සඳහා හොඳම නිදර්ශනය වන්නේ ද රුවන්වැලි ස්තූපයයි. මෙම විශ්ලේෂණාත්මක ලිපියේ දී රුවන්වැලි ස්තූපය හා සම්බන්ධ ඉතිහාසය ප්‍රධාන අවධි තුනක් හා තෙවැනි අවධියේ උප අවධි තුනක් යටතේ සාකච්ඡාවට බඳුන් කෙරේ.

01. ඈත කාලීන ඉතිහාසය (ක්‍රි.පූ. 161 - 1029 දක්වා කාලය)

02. මධ්‍යකාලීන ඉතිහාසය (වර්ෂ 1029 - 1815 දක්වා කාලය)

03. මෑත කාලීන ඉතිහාසය (වර්ෂ 1815 - 1980න් ද පසු අවධිය දක්වා කාලය)

3.1. මෑත කාලීන ඉතිහාසයේ ප්‍රාරම්භක අවධිය හෙවත් මුල් මෑත ඉතිහාසය (වර්ෂ 1815 - 1980 කාලය)

3.2. මෑත කාලීන ඉතිහාසයේ ද්විතීයික අවධිය හෙවත් මධ්‍ය මෑත ඉතිහාසය (වර්ෂ 1890 - 1980 කාලය)

3.3. මෑත කාලීන ඉතිහාසයේ තෘතීයික අවධිය හෙවත් 1980න් පසු නූතන මෑත ඉතිහාසය

සමස්තය වශයෙන් රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් වන පැරණිතම මූලාශ්‍රමය සාධක 'ඈත කාලීන ඉතිහාසය' ලෙස අප විසින් පෙන්වා දී ඇත. මෙම කාලසීමාවේ දී රුවන්වැලි ස්තූපය ඉදිකිරීම, නව කොටස් එකතු කිරීම, ස්තූපය විශාල කර බැඳීම, හුණු ආලේප කිරීම මෙන්ම දෛනික නඩත්තු කටයුතු වෙනුවෙන් ගම්වර පූජාකිරීම් පිළිබඳ තොරතුරු මූලාශ්‍ර තුළින් හඳුනා ගත හැකි ය. මෙම පරිච්ඡේදයේ ආරම්භය ක්‍රි.පූ. 161 ලෙස සඳහන් කරන ලද්දේ ස්තූපය ඉදිකරන ලද දුටුගැමුණු රජුගේ රාජ්‍යප්‍රාප්තිය අනුව යමිනි. කෙසේ නමුදු මෙම අවධියේ අවසානය අනුරාධපුර අවධියේ අවසානයත් සමග නිම වේ.

අනතුරුව වූ කාල පරිච්ඡේදය ස්තූපය සම්බන්ධයෙන් මැදිහත් වීමේ 'මධ්‍ය කාලීන ඉතිහාසය' ලෙස පෙන්වා දී ඇත. ප්‍රධාන වශයෙන් මෙහි දී අවධානය යොමු වන්නේ අනුරාධපුර අවධියෙන් පසු හා වර්ෂ 1815 දක්වා වූ වර්ෂ 800කට ආසන්න කාලසීමාවක් කෙරෙහි ය. සම්මත රාජධානි අනුපිළිවෙල අනුව අනුරාධපුරයෙන් පසු එළඹෙන පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ, මහනුවර[2] යන සියලු රාජධානි සමයන් අයත් වන්නේ මේ කාල වකවානුවට ය.

ඉහතින් පෙන්වා දෙන ලද තෙවැනි කාල වකවානුව "මෑත ඉතිහාසය" ලෙස පෙන්වා දී ඇත. එහි දී අවධානය යොමු වන්නේ වර්ෂ 1815 සිට වර්තමානය දක්වා වූ මැදිහත් වීම් කෙරෙහි ය. අධ්‍යයනයේ පහසුව තකා එය ද ප්‍රධාන කාල වකවානු තුනකට බෙදා වෙන් කර ගන්නා ලදි.

'මෑත කාලීන ඉතිහාසයේ ප්‍රාරම්භක අවධිය හෙවත් මුල් මෑත ඉතිහාසය' තුළ අධ්‍යයනයට භාජනය කෙරෙනුයේ බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව ඔවුන්ගේ කිරීටය යටතට පත් කර ගත් ව්‍යාවහාර වර්ෂ 1815 සිට පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව (Archaeological Survey Department) මෙරට පිහිටවූ ව්‍යවහාර වර්ෂ 1890 තෙක් වූ කාල පරිච්ඡේදයයි. නිශ්චිත පුරාවිද්‍යාත්මක පදනමක් නොවූව ද මේ කාලයේ දී ඉංග්‍රීසීන්ගේ අවධානය මේ විස්මය දනවන මහා ස්තූපය කෙරෙහි නිරායාසයෙන් යොමු විය. එපමණක් නොව පොදු වැඩ දෙපාර්තමේන්තුව හා අටමස්ථාන කමිටුව වැනි දේශීය ආයතන හා සංවිධාන ද යම් යම් මැදිහත් වීම් මේ ස්තූපය සම්බන්ධයෙන් සිදු කර ඇත.

'මෑත කාලීන ඉතිහාසයේ ද්විතීයික අවධිය හෙවත් මධ්‍ය මෑත ඉතිහාසය' ප්‍රධාන වශයෙන් නියෝජනය කරන්නේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතු සම්බනධයෙන් ඍජු දායකත්වයක් සපයන පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ (පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව) කාර්යයභාරය තුළ

---

[2] ඇතැම්විට ඉන් අනතුරුව එළඹෙන්නේ යයි ඇතැමුන් පෙන්වා දෙන ගම්පොළ අවධිය ද ඇතුළත් වනු වටී.

රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් වූ මැදිහත් වීම පිළිබඳව යි. එනම්, 1890 සිට 1980 දක්වා වූ කාල වකවාණුවයි.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ ආරම්භයට සමගාමීව වර්ෂ 1980 දී ස්ථාපිත වූ මධ්‍යම සංස්කෘතික අරමුදල යුනෙස්කෝ (UNESCO) හි ජාත්‍යන්තර සහයෝගීත්වය මත සංස්කෘතික ස්මාරක ස්ථාන ආරක්ෂා කිරීමේ දැවැන්ත වැඩපිළිවෙලක් ආරම්භ කරයි. මෙහි දී අනුරාධපුරය කේන්ද්‍ර කර ගනිමින් මහාවිහාරය, අභයගිරිය හා ජේතවනාරාමය යන ප්‍රධාන මහා විහාරීය ආරාම ත්‍රිත්වය පාදක කර ගත් ව්‍යාපෘති තුනක් පිහිටුවන ලදී. රුවන්වැලි ස්තූපය ප්‍රධාන කොටගත් පරිශ්‍රය වූයේ මහාවිහාර ව්‍යාපෘතියයි. 'මෑත කාලීන ඉතිහාසයේ තෘතීයික අවධිය හෙවත් වර්ෂ 1980න් පසු නූතන මෑත ඉතිහාසය' තුළ ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට බඳුන් කෙරෙනුයේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ දායකත්වයෙන් ස්තූපවල ආරක්ෂාව වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගයි. රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් ඍජු මැදිහත් වීමක් නොවූව ද ස්තූපය හා තදානුබද්ධ ස්මාරක ශේෂයන් පිළිබඳ සංරක්ෂණ මෙහෙයවීම් සිදු කරන්නට මේ අවධියේ දී කටයුතු කරයි. මීට අමතරව මෙම තෘතීයික අවධියේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ද යම් යම් පුරාවිද්‍යා කටයුතු මෙම විහාර පරිශ්‍රයේ සිදුකරන ලද බවට වාර්තා වේ.

## (01) ඈත කාලීන ඉතිහාසය (ක්‍රි.පූ. 161 - 1029 දක්වා කාලය)

### 01.1. රුවන්වැලි දාගැබ ඉදිකිරීම

දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161 - 137) විසින් මහින්ද මහ රහතන් වහන්සේ විසින් පෙන්වා දුන්, දේවානම්පිය තිස්ස රජු (ක්‍රි.පූ. 250 - 210) විසින් ටැම් සිටුවා වෙන් කරන ලද භූමියෙහි රුවන්වැලි ස්තූපය[3] ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි (ජයවර්ධන, 1991, 68). රජු වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනයෙක විසා නැකතින් අත්තිවාරම් කැපීම ආරම්භ කළ බව වංශකතාව පෙන්වා දෙයි. ඊට අනුව මේ අයුරින් පොළොව රියන් සතක්[4] යටට කැණ

[3] වංසකතාවල හා සෙල්ලිපි මූලාශ්‍රවල මහතුබ (IC., 1983, 74,111), මහචෙය හෝ මහචෙත (do., 197, 221), මහාචේති (දීව., 10:19), මහාථූප (මව., 23-26 පරි.; 34:23; දීව., 20:1,5,10; 21:1,13,18,21,25,26, 22:35,25,38,46, 47,50,60) , හේමමාලි (මව., 15:166-167), සුවණ්ණමාලී, සොණ්ණමාලී, රත්නමාලී, රත්නමාලිකචේතිය (හෙට්ටිආරච්චි, 2009, 29; ජවර්ධන, 1991, 72), රුවන්මැලි (EZ., IV, 1943, 255), රුවන්වැලි (EZ., II, 1985, 77,108,135), රුවැලි මහ සෑ, රුවන් දාගැබ යනාදී විවිධ නාමයන් මෙම ස්තූපය හැඳින්වීම සඳහා යොදාගෙන තිබේ (හෙට්ටිආරච්චි, 2009, 26-32; ජවර්ධන, 1991, 72).

[4] රියන පිළිබඳව විවිධ මතිමතාන්තර තිබේ. රියනක ප්‍රමාණය අඟල් 30ක් හෙවත් අඩි දෙක හමාරක් බව රත්නායක විසින් පෙන්වා දෙයි (රත්නායක, 2009, 70). පරණවිතාන මහාතා *Cey.J.Sci. Section G, Vol. II* ට අනුව පෙන්වා දෙන්නේ පැරණි ශ්‍රී ලංකාවේ භාවිත වූ වඩු රියන දිගින් අඟල් 30ක් පමණ වූ බවයි (පරණවිතාන, 1997, 5). රියනට අඟල් 27ක් බව ශ්‍රීමත්

තිබේ. අත්තිවාරම ශක්තිමත් කිරීම සඳහා යෙදූ කළු ගල්, සිය පාද ආරක්ෂා කර ගැනීම සඳහා යෙදූ සම් ආවරණ සහිත අලි ඇතුන් ලවා පාගවා ශක්තිමත් කළ බව පැවසේ (මව[5]., 29, 1-4). මෙහි දී පාදම ශක්තිමත් කර ගැනීම සඳහා වර්තමානයේ යොදා ගන්නා වූ කොන්ක්‍රීට් පදනමකට සමාන වූ ශක්තියක් අපේක්ෂා කළ බව මහාවංසයේ 29වන පරිච්ඡේදය වඩාත් විමසිල්ලෙන් බැලීමේ දී පෙනී යයි. එහි දී,

- පොළොව මට්ටමේ සිට රියන් සතක් යටට කැණීම.
- සුණු ගල් කුඩු කර ඒ මත හෙලීම හා ඇතුන් ලවා පැගවීමෙන් භූමිය ඝන බවට පත් කිරීම.
- වෙඬරු (නවනීත) මැටි නමින් හඳුන්වන වඩාත් සියුම් මැට්ටක් ඇතිරවීම. වංසත්ථප්පකාසිනියට අනුව කුස්තුර මැකී යන පරිදි මෙසේ මැටි ඇතිරීම සිදු කර තිබේ (වංසත්ථප්පකාසිනී, 2001, 411).
- ඊ/ඒ මත ගල් ඇතිරවීම.
- ශුද්ධ වූ කරගල් තට්ටුවක් යෙදීම (මව. සුමංගල දේවරක්ෂිත) මෙම කරගල් යන්න වංසත්ථප්පකාසිනියේ (2001, 411) හා ආනන්ද ගුරුගේ මහතා (මහාවංසය, 2007) විසින් අරුත් ගන්වන්නේ ගඩොල් ලෙසයි. මේ සඳහා පුළුස්සන ලද ගඩොල් විශේෂයෙන් භාවිත කරන ලද බව පැවසීම සඳහා මෙය යොදන්නට ඇත. මෙයින් මේ සමය වන විට නොපුළුස්සන ලද ගඩොල් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගන්නට ඇති බවට ද ඉඟි ලබා දෙයි. මේ ගඩොල් තට්ටුව මත බොල් බොරළු තට්ටුව කැට මුසු ගල් තට්ටුවක් සේ රළු පහස ඇති හුණු බදාම තට්ටුවක් ද ඇතිර වූ බව මහාවංස ටීකාකරු පෙන්වා දෙයි (වංසත්ථප්පකාසිනී, 2001, 411).

---

ජේම්ස් එමර්සන් ටෙනන්ට් පෙන්වා දෙයි. එම් බී ආරියපාලට අනුව වඩු රියන අඟල් 24කි. මානසාර නම් වාස්තුවිද්‍යා ග්‍රන්ථයේ රියන් (හස්ත) වර්ග 4ක් පිළිබඳව පවසයි. ඒවා අඟල් 24,25,26,27 ප්‍රමාණවලින් යුතුව තිබේ. මේ හැරෙන්නට අඟල් 18කින් යුතු රියනක් ද ලංකාවේ භාවිතව ඇත (වික්‍රමගමගේ, 1986, 15).

[5] මව යන්න මෙතැන් පටන් යොදනුයේ මහාවංසය යනනෙහි ලුහුඬු නාමය වශයෙනි. එයින් මහාවංශය (2006). නායක මාහිමි, ශ්‍රී සුමංගල. සහ දේවරක්ෂිත පඬිතුමන්, බටුවන්තුඩාවේ. (සිංහල පරි.), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10. යන කෘතිය පිළිබඳව කියැවේ.

- කුරුවින්ද[6] නම් පාෂාණ තට්ටුවක් ඇතිරවීම.
- යකඩ දැලක් එළීම.
- ඒ මත බොරළු ඇතිරවීම. මේ සම්බන්ධයෙන් වංසත්ථප්පකාසිනියේ දක්වන්නේ මරුම්බ නම් සුවඳවත් මැටි විශේෂයක් හිමාලයෙන් ගෙන්වා යකඩ දැල මත හෙළූ බවයි (2001, 411). මෙහි දී පැහැදිලි වන ප්‍රධාන කාරණයක් වන්නේ පෙර එළන ලද යකඩ දැල මත යම් මැටි විශේෂයක් යොදන ලද බවයි. කවර ලෙසකින් හෝ ඉදිකරන ලද නිර්මාණයේ ශක්තිය සම්බන්ධයෙන් සැළකීමේ දී මේ අයුරින් මැටි තට්ටුවක් යෙදිය යුතු මය. මන්ද ඒ මත පළිඟු ගල් ඇතිරවූයේ වී නම් ඒ අතර බන්ධන මාධ්‍යයක් සක්‍රීය නොවේ.
- පළිඟු ගල්[7] ඇතිරවීම.
- නැවත ගල් ඇතිරවීම.
- රසදිය හා මිශ්‍ර කළ දිවුල් ලාටු (මැලියම්) ගල් අතර යෙදීම.
- අඟල් අටක් ඝණකම ඇති ලෝහ දැලක් ඒ මත එළීම.
- රත්හිරියල් තල තෙල් සමග මිශ්‍ර කර තට්ටුවක් සේ යෙදීම.
- අඟල් සතක් ඝණැති රිදී දැලක් ඒ මත ඇතිරවීම (මව., 29, 3-12; වංසත්ථප්පකාසිනී, 2001, 410-411; මහාවංසය, 2007, 556-557).

මේ අයුරින් ස්තූප පාදම ශක්තිමත් අයුරින් නිර්මාණය කර ගැනීම සඳහා උපරිම තාක්ෂණයක් භාවිත කිරීමට නිර්මාණ ශිල්පීන් කටයුතු කොට ඇති බැව් වංශකතාව අධ්‍යයනයේ දී පැහැදිලි වේ. දෘඪ ගල් මත මෘදු මැටි වැනි දේ යෙදීමෙන් ද ඒවා මත යකඩ දැල් ආදිය යෙදීමෙන් ද පැහැදිලි වන්නේ මෙම පෞඪ නිර්මාණයේ කල් පැවැත්ම කෙරෙහි අවධානයෙන් මේ ශිල්පීන් කටයුතු කර ඇති බවයි. නමුත් මෙම දාගැබේ පාදම පිහිටුවා ගත්තේ කුමන පාංශු තලයකදැයි මහාවංසයේ විස්තර නොමැත. එසේ වුව ද දීපවංස විස්තරයකට

[6] ආනන්ද ගුරුගේ මහතාට අනුව මේ නමින් හඳුන්වා ඇත්තේ තිරුවාණ පාෂාණයි (මහාවංසය 2007:556). නමුත් මහාවංස ටීකාකරු එය අර්ථ ගැන්වීමෙහි නොයෙදෙයි.

[7] මේවා තිරිවාන විය හැකි බව හෙට්ටිආරච්චි පෙන්වා දෙයි (2009, 34).

අනුව පිහිටි ගල් තලය *(ථූලසෙල)* මතුයෙහි සිට[8] මහා ථූපයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේ. තව ද පාදමේ සිට ගඩොල් භාවිත කරන ලද බවක් මහාවංසයේ විස්තර නොකෙරෙතත්, දීපවංසයේ එබන්දක් විස්තර කරයි (එම). ජේතවන ස්තූපයේ (Bell, 1894, 2) හා අභයගිරි ස්තූපයේ පාදමේ සිටම ගඩොල් භාවිත කර ඇති බව පුරාවිද්‍යාත්මක සාධක තුළින් ද සනාථ වන බැවින්, රුවන්වැලි ස්තූපයේ නිර්මාණාත්මක ස්වභාවය සම්බන්ධයෙන් දීපවංසයේ අනාවරණයන් වඩා විශ්වසනීය ලෙස භාවිතයට ගත හැකි බව පැහැදිලි ය.

මැටි සඳහා නවනීත මැටි[9] පමණක් යොදා ගත් බව මහවංසය විශේෂයෙන් පෙන්වා දෙයි. රසදිය මුසු කළ දිවුල් මැලියම්, තලතෙල් ආදිය බදාම සඳහා යොදා ගන්නට ඇත්තේ බන්ධන මාධ්‍යයක් වශයෙනි. දීපවංසයට අනුව නම් මේ සඳහා යොදා ගෙන ඇත්තේ 'සක්ඛර'ය[10]. එය ද ශක්තිමත් බදාමයක් ලෙස භාවිත කළ හැකි බව හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 34-35). මේ අයුරින් දෙමසක කාලයක් තුළ සිදු කරනු ලැබූ පාදම් නිර්මාණයෙන් ද ශක්තිමත් කිරීමෙන් ද අනතුරුව ස්තූපකරණය සඳහා ගඩොල් තැබීම සිදු කරන ලදි (මව., 29:15-63). මෙසා දැවැන්ත නිර්මාණයක් සඳහා ගඩොල් සපයා ගැනීම ඊළඟ කාර්යය විය. ලබා ගන්නා ගඩොල ස්තූපයේ පැවැත්ම පිළිබඳ තහවුරුව සපයන්නා වූ ප්‍රධානතම මූලයයි. රජු මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරයි. මහා පරිමාණ ගඩොල් නිෂ්පාදකයන් පිළිබඳ විශ්වාසයක් නොමැති හෙයින් වඩාත් විමසිලිමත් වූයේ තාක්ෂණික අතින් වඩාත් උසස් නිර්මාණ සිදු කරන්නන් කෙරෙහි ය. අවසන එබඳු උළු වඩුවෙක්[11] මුණගැසුන අතර, ඔහුට චෛත්‍යකර්මය භාර කරන ලදි. ඉන් අනතුරුව ස්තූපයේ ප්‍රධානතම කාර්යය වූයේ ධාතු නිධන් කිරීමයි. මෙතෙක් සාහිත්‍ය ලේඛනයක ස්තූප ධාතුගර්භයක් පිළිබඳව සඳහන් කරන දීර්ඝතම විස්තරය මහාවංසය සපයන්නේ රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙනි (30:60-100). අනතුරුව මහා පිරිසකගේ මැදිහත් වීමෙන් මහත් ගෞරව සහිතව ධාතු

---

[8] *''සුධාභූමි ථූලසේලං මත්තිකං ඉට්ඨිකායච - විසුද්ධ භූමිකාවෙ ච අයෝ ජාලං මරුම්බකං''* (දීව., 19:2)

[9] ...... සැම තන්හි මැටියෙන් කටයුත්තෙහි නවනීත නම් මැටිම විය (මව., 29:10-11).

[10] පාලි ශබ්දකෝෂයට අනුව 'සක්ඛර' යනු උක් සකුරු ය (බුද්ධදත්ත හිමි, 1950, 482).

[11] ඉක්බිති පණ්ඩිත ව්‍යක්ත වූ උළු වඩුවෙක් තෙම වනෙහි කොටවා කුල්ලෙන් වැඩූ කල්හි මම දා ගලෙහි අඹරවා මැටි අමුණක් (එක දවස ගෙන්වන්නෙමි) මෙහි චෛත්‍යයෙහි තෘණාදීහු ද නොවන්නාහු යයි නරනිඳුහට කීයේ ය (මව., 30, 9-10). ස්මාරක සංරක්ෂණයේ මූලික සංකල්ප ගැබ්ව ඇති මේ ගාථාද්වය උරුම කළමනාකරණය සම්බන්ධයෙන් ද ඉතා වැදගත් වූ ප්‍රකාශයකි. විශේෂයෙන් මූලික ඉදිකිරීමේ දෝශ පවතින්නේ නම් ඉතා කෙටි කාලයකින් ස්මාරකයක් සංරක්ෂණ මැදිහත් වීම් වෙත යොමු කරවයි. මේ ආකාර වූ ගඩොල් යොදා ගත්තේ නම් ඉතා දීර්ඝ කාලයක් ස්වභාවික ව්‍යසනයන්ට ගොදුරු නොවී ගඩොල් ස්මාරක ආරක්ෂා කර ගැනීමේ හැකියාව ඇති වේ. නමුත් ස්තූපයේ ශක්තිය පිළිබඳ මූලධර්ම ස්ථානයෙන් ස්ථානයට වෙනස් අයුරින් බලපායි. ඒ අනුව ස්ථානීයව වෙනස් ගුණ සහිත ගඩොල් භාවිත කිරීමට ද සිදු වන අවස්තා පවතී.

ගර්භයෙහි ධාතු නිධන් කරවා, එහි ගෝලාකාර බඳ ඉදි කිරීමේ කටයුතු අවසන් කොට සතරැස් කොටුව ද සමගින් ස්තූපයේ බොහෝ ප්‍රමාණයක වැඩ කටයුතු අවසන් කරයි (එම., 31:1-125). කොත ඉදි කිරීමත්, හුණු පිරියම් කිරීමත් තිබිය දී දුටුගැමුණු රජු මරණාසන්න වූයෙන් සොයුරු සද්ධාතිස්ස කුමරු ශ්වේත වර්ණ රෙදි ගෙන ඒවායින් චෛත්‍යය ආවරණය කොට අංග සම්පූර්ණ මහා ස්තූපය ලෙස දුටුගැමුණු රජුට මරණාසන්න මොහොතේ දී පෙනෙන්නට සළස්වූ බව මහාවංසය පෙන්වා දෙයි (එම., 32:1-6).

දුටුගැමුණු රජුගේ අභාවයෙන් අනතුරුව ක්‍රි.පූ. 137 දී පාලකයා බවට පත් සද්ධාතිස්ස රජු රුවන්වැලි සෑයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කොට එය පූර්ණ වශයෙන් නිමවා, හුණු ද පිරියම් කර, හස්ති ප්‍රාකාරයක් ද බැඳ (එම. 33:5-6) එතෙක් ලංකාවේ විශාලතම ස්තූපය බවට පත් කරමින් රුවන් වැලි ස්තූපයේ ඉදිකිරීම් කරයුතු අවසන් කර තිබේ. පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ සද්ධාතිස්ස රජු විසින් ස්තූපයේ කොත් කැරැල්ල ඉදිකරන ලද බවකි (කුලතුංග, 2001, 32).

අවසන් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම ස්තූපයේ උස ප්‍රමාණය මීටර් 101.40ක් පමණ වූ බව පැවසේ (හෙට්ටිආරච්චි, 2009, 23). සෙල් ඇතිරූ මළුව සමාන දිග පළලකින් යුතු අතර, එය මීටර් 143කි. සලපතළ මළුවට ඔබ්බෙන් ඇති සීමා ප්‍රකාරයේ ඉදිරි මුහුණතෙහි මීටර් 2.70ක් පමණ උසැති ඇත් රූප 334කි. ඒවා අතරින් පැරණිම ඇත් රූප පන්තියේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා ආරක්ෂා කොට ඇති ඇත් රූප කිහිපයක් බටහිර දොරටුව සමීපයෙහි වර්ථමානයෙහි ද වෙයි හත්ථිප්‍රාකාරයෙන් පිටතට විහිදී ගිය වැලි මළුව මීටර් 30කට ආසන්න පළලකින් යුතු වේ. සිව් දිශාභිමුඛව වැලි මළුව සමාන දිග ප්‍රමාණයක් නියෝජනය කරන අතර, එය මීටර් 205කි. ස්තූපයට බද්ධව සලපතළ මළුව මත ප්‍රවේශ ද්වාරයන්ට මුහණලා පිහිටි 'වාහල්කඩ'[12] හෙවත් 'ආයක' (එම., 23) අතරින් තුනක් ම උපරිභාගය පිළිබඳ කල්පිත අදහසින් ප්‍රතිසංස්කරණය කර තිබේ. දැනට බටහිර දිගින් වූ ආයකය පමණක් පැරණි ස්වරූපයෙන් ම ආරක්ෂා කර ඇත. ප්‍රධාන දාගැබ පිරිවර කොට සලපතළ මළුවෙහි මුළු සතර නියෝජනය වන ලෙස නිර්මාණය කර ඇති පරිවාර දාගැබ් සතරින් ගිණිකොණ දිග හා නිරිත දිග කුඩා දාගැබ් ජේ.ජී. ස්මිදර්ගේ (Smither, 1993, pl.xxiii) පැරණි සැළසුම්වල පැවතී ඇති හෙයින් සෙසු මුළු නියෝජනය වන ලෙස ද දාගැබ් පැවතිය හැකි බව පරණවිතාන 1963 දී විස්තර කර තිබේ (පරණවිතාන, 2005, 59). 1960 දශකයේ අවසන් සමය වන විට මේවායින් සියල්ල ප්‍රතිසංස්කරණය කර තිබේ (හෙට්ටිආරච්චි 2009:25).

---

[12] .......... විශාල දාගැබ් අතුරෙන් බොහොමයක ම සතර සිග්භාගයන්හි දොරටුවලට මුහුණ ලා ඇති අනුලම්බ හෙවත් ප්‍රකෂේපණ නූතන සිංහලයේ "වාහල්කඩ" නමින් හඳුන්වනු ලැබේ (පරණවිතාන, 2005, 38).

නැගෙනහිර දොරටුවට වම් පසින් සලපතළ මළුවේ පිහිටා ඇති විහාර මන්දිරය තුළ පවත්නා බුදු පිළිම හතර අයත් කාලය පිළිබඳව ආනන්ද කුමාරස්වාමි මහතා අනුගමනය කරමින් පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ ක්‍රි.ව. දෙවැනි ශතවර්ෂයට ඒවා අයත් බවයි (පරණවිතාන 2005, 59).

මෙම විහාර ගෘහය අබියස පැරණි ශිලාමය කාන්තා රුවක්[13], භාතිය රජුගේ යයි වැරදි ලෙස හඳුනා ගත් කණිට්ඨතිස්ස රජුගේ ප්‍රතිමාවක්[14] ද හඳුනා ගත හැකිය (හෙට්ටිආරච්චි, 2009, 24). නැගෙනහිර ප්‍රවේශයෙන් දකුණු පසට වන්නට ඇති දුටුගැමුණු රජුගේ යයි සැළකෙන ප්‍රතිමාව[15] මීටර් 2.85ක් තරම් උසය. මෙය හමු වී ඇත්තේ සලපතළ මළුවේ ස්තූපයට ආසන්නයෙහි. දාගැබේ නිරිත දෙසින් මීටර් 1.60ක පමණ උසකින් යුතු කුඩා ප්‍රමාණයේ ස්තූපයක් (සැලසුම 2.2) දැක ගත හැකි අතර, මෙය අනුරාධපුර අවසන් භාගයට හෝ පොළොන්නරු අවධියට අයත් විය හැකි බව පරණවිතාන මහතා පෙන්වා දෙයි (2005, 59).

### 01.2. රුවන්වැලි ස්තූපය ඉදිකිරීමෙන් පසු මැදිහත් වීමේ ඈත කාලීන ඉතිහාසය

මෙම ස්තූපය ඉදිකිරීමේ මූලික මෙහෙයවීමෙන් අනතුරුව මුල්ම මැදිහත්වීම සිදු කරන ලද පාලකයා බවට සාහිත්‍ය මූලාශ්‍රයෙහි සඳහන් වන්නේ සද්ධාතිස්ස රජු (ක්‍රි.පූ. 137 - 119) ගේ නාමයයි. මහාවංශයට අනුව ඔහු ඡත්‍ර නැංවීම, හුණු ආලේප කිරීම, ඇත් පවුර කරවීම (මව., 33:5-6) කරවූ අතර දීපවංසයට අනුව ඔහු විසින් ඇත් පවුර බැඳීම, කඤ්චුකයක් හා කාරාපිණ්ඩයක්[16] කරවීම යන ඒවා සිදුකරතිබේ (දීව[17]., 20:5).

සද්ධාතිස්ස රජු ගේ සහෝදරයෙකු වූ ලජ්ජිතිස්ස රජු (ක්‍රි.පූ. 119-109) මහාථූපය සඳහා නව වාස්තුවිද්‍යාත්මක අංග එක් කරයි. එසේ එකතු කරන අංග අතර 'තිලඤ්ජනයක්' පිළිබඳව දීපවංසය කියයි (20:10). සිංහල පරිවර්තනයට අනුව

---

[13] මෙම රූපය විහාර මහා දේවියගේ යයි විශ්වාස කෙරේ (හෙට්ටිආරච්චි 2009:24).

[14] මේවා පරණවිතාන මහතා විසින් පෙන්වා දෙන්නේ බෝධිසත්ත්ව ප්‍රතිමා ලෙසයි (2005:59).

[15] පරණවිතාන මහතා විසින් පෙන්වා දෙන්නේ මෙය බෝසත් රුවක් විය හැකි බවයි (2005, 59). කඹුරුපිටියේ වනරතන හිමියන් විසින් ද පරණවිතාන අදහස පිළගනී (1970, 82). මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවක් බව කේව් විසින් ද පෙන්වා දී ඇත (1956, 42). නමුත් නන්දදේව විජේසේකර මහතාගේ අදහස නම් මෙයින් සැදැහැති රජ කෙනෙකුන් නිරූපණය කරන බවයි (1970, 254).

[16] පරණවිතානයන් පෙන්වා දෙන්නේ කරච්ඩක යනුවෙන් වූ මෙය කොත්කැරැල්ල විය හැකි බවයි (IC., II, 1983, 50). නමුත් හෙට්ටිආරච්චි මහතාගේ අදහසට අනුව නම් මෙය යූපස්ථම්භය කි (2009, 37).

[17] මෙහි දීව යන්නෙන් දීපවංසය යන්න කියැවේ. එය ද, *දීපවංසය* (1970). කිරිඇල්ලේ ඥාණවිමල හිමි (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. යන කෘතියයි.

මෙයින් කියැවෙන්නේ මල් ආසන තුනක් පිළිබඳව ය (හෙට්ටිආරච්චි, 2009, 37-38). වංසත්ථප්පකාසිනියට අනුව ද කරවා ඇත්තේ සෙල් මුවා ආසන තුනකි (වංසත්ථප්පකාසිනී, 1997, 33:22). නමුත් මෙහි සඳහන් 'පුප්ඵාදාන' යන වචනය ගුරු තන්හි තබා ගනිමින් සෙනරත් පරණවිතානයන් පෙන්වා දෙන්නේ මේවා ජේසා වළලු බවයි (13-14). එපමණක් නොව මුලින් පැවති ජේසා වළලු ගඩොලින් තිබූ බවත්, ලජ්ජිතිස්ස රජු (ක්‍රි.පූ. 119-109) විසින් ඒවා සුදු හුණු ගල්වලින්[18] ආවරණය කර ඇති බවත් සඳහන් කරයි (එම). මෙම මතය සනාථ කරන හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙන්නේ ජේසා වළලු මත තිබූ ශිලා තලයන් හි සෙල් ලිපි මඟින් ක්‍රිස්තු පූර්ව සමයේ තොරතුරු කියැවෙන බව යි (හෙට්ටිආරච්චි, 2009).

මහවංසය පෙන්වා දෙන ආකාරයට බල්ලාටනාග රජු (ක්‍රි.පූ. 109-103) විසින් වැලි මළුවට පිටින් ඇති ප්‍රාකාරය[19] කරවා තිබේ (මව., 33:31). කෙසේ නමුත් මේ ප්‍රකාශයට අනුව වැලි මළුවක් පැවතියේ නම් තවත් මළුවක් පැවතිය යුතුය[20]. වැලි මළුව මොහු විසින් කරවන ලද්දේ ද යන්න නිශ්චිත නොවන නමුත්, කලින් පැවති එය ක්‍රමාණුකූල ලෙස සකස් කිරීම හෝ ඔහු විසින් කරවන්නට ඇත (හෙට්ටිආරච්චි, 2009, 38).

භාතිකාභය රජු (ක්‍රි.පූ. 19 - ක්‍රි.ව. 9) විසින් මහාථූපයට වේදිකා දෙකක්[21] එක් කරන ලද බව පැවසේ. වංසත්ථප්පකාසිනියේ මේ දෙක 'කුච්ඡවේදිය' හා 'මුද්ධවේදිය' (1994, 506) ලෙස හඳුන්වාදෙන අතර, මේවායේ පිහිටීම සම්බන්ධයෙන් ඉන්දියානු සංචි ස්තූපයේ හා දැලිවල කොටවෙහෙරින් සොයා ගත් ධාතු කරඬුවක ස්වභාවයන් ද සළකා වඩාත් විස්තරාත්මක කථනයක් සෙනරත් පරණවිතාන විසින් සිදු කරයි (2005, 15:25). ඊට අනුව 'කුච්ඡවේදිය' ස්තූපයේ පහළ සිට තෙවන ජේසාව මත පැවති බව ද, 'මුද්ධවේදිය' හතරැස් කොටුව අවුරා කරන ලද්දක් බව ද ඔහුගේ නිගමනය වේ. මීට සමගාමීව පාපිළිකඩ නමින් ද වචනයක් මහාවංසය ඉදිරිපත් කරයි (34:41). පරණවිතානයන් මෙය අරුත් ගන්වන්නේ දාගැබ් පාමුළ වූ ගරාදිවැටක් ලෙස යි (2005, 57). භාතිකාභය රජුගේ වෙනත් කාර්යයන් අතර, දාගැබ මත ඡත්‍ර

[18] 1945 දී දකුණු ආයක කැණීම් සිදු කිරීමේ දී මේ සාධක මුල් වරට අනාවරණය කරගෙන තිබේ (නිශාන්ති, 2001, 3).

[19] ........ මනරම් රුවන් මල් නම් මහ සෑය හාත්පස වැලිමලු සීමායෙහි පවුරු ද කරවීය ........(මව., 33:31).

[20] මෙය වර්තමාන සෙල් ඇතිරූ මළුව නමුත් ඒ සමයේ සෙල් හෝ ගඩොල් අතුරා එය තිබෙන්නට ඇතැයි හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි. මෙම සාධකය තහවුරු කිරීමේ දී අභයගිරි, ජේතවන මෙන්ම තිස්සමහාරාම දාගැබ් මළුවල සිදු කරන ලද කැණීම්වලින් දාගැබ් මළුවේ සෙල් ඇතිරුමට යටින් ගඩොල් ඇතිරුමක සාධක අනාවරණය වීම යන සාධකය උපයෝගී කර ගනී (හෙට්ටිආරච්චි, 2009, 38). ඒ හැරෙන්නට සෝමාවතී දාගැබ් මළුවේ දැනුදු මේ ගඩොල් ඇතිරුම දැක ගත හැකිය.

[21] ......... මහ සෑයෙහි පිළිකඩ දෙක ද ....... (මව., 34:39).

නැංවීමත් (මව., 34:41-44), හුණු ආලේප කිරීමත් (එම., :46), අභය වැවේ ජලය යන්ත්‍රානුසාරයෙන් ගෙන මහාථූපය නැහැවීමත් (එම., :45) සඳහන් වේ. මෙහි දී හුණු ආලේප කිරීමේ දී හුණු ගැල් සියයක් මුතු හා තල තෙල් සමග මිශ්‍ර කර ආලේප කළ බව කියයි (එම., :45).

මහාදාඨික මහානාග (ක්‍රි.ව. 9-12) රාජ්‍ය සමයේ දාගැබ් මළුවේ **කිඤ්චික්ඛ පාසාණ**[22] අතුරුවා, වැලි මළුව විශාල කරවා සීමා ප්‍රාකාරයක් ද බැන්ද වූ බව පවසයි (එම.34:70). ආමණ්ඩ ගාමිණී අබය (ක්‍රි.ව. 22-31) රජු විසින් මහා තූපයේ ඡත්‍ර මත ඡත්‍ර නැංවූ බව ද, **'පාදවේදිය' හා උද්ධවේදිය'** නිර්මාණය කළ බව[23] ද සඳහන් වේ (මව., 35:2). මෙසේ ඡත්‍ර පිට ඡත්‍ර නැංවීම මෙරට පැවති බව සනාථ කරන පුරාවිද්‍යාත්මක සාධක අතර, රුවන්වැලි සෑ සෙල් මළුවෙන් ලැබෙන සිරිපතුල් ගල් කැටයමක වූ ස්තූප සටහන් මෙන් ම අභයගිරි ස්තූපයෙන් හමු වූ ධාතු කරඬුවල හැඩය සාක්ෂ්‍ය සපයයි (හෙට්ටිආරච්චි, 2009, 43). පළවන සිරිනාග රජු (ක්‍රි.ව. 195-214) විසින් මෙම ස්තූපයේ ඡත්‍රය කරවා ඇත (දීප., 1970:22). සංඝතිස්ස රජු (ක්‍රි.ව. 247-251) විසින් ස්තූපයේ උපරිභාගයේ ස්වර්ණමය ඡත්‍ර කරවීම හා මාණික්‍යමය ශිඛා ථූපයක් කරවන ලදී[24] .

ධාතුසේන රජු (ක්‍රි.ව. 459-477) විසින් සෑ තුනෙහිම දිරා ගිය ඡත්‍ර කරවා තිබේ (මව. 38:54-55). මහානාග රාජ්‍ය (ක්‍රි.ව. 573-575) සමයේ මහා චෛතිය තුනෙහි ම හුණු ආලේපකරවා **'චුම්බටකය'**[25] ද 'හත්ථිවේදිය' ද ඒවායේ චිත්‍රකර්මයන් ද කරවූ බව මහාවංසය පෙන්වා දෙයි (40:95-96). පරණවිතාන මහතා පෙන්වා දෙන ආකාරයට මේ 'හත්ථිවේදිය' නම් හස්ති ප්‍රාකාරය නොව, තෙවන පේසාව මත පිටට නෙරන ලෙස පිහිටුවන ලද හස්ති හිස් රූප (සැලසුම 2.3) පෙළ යි (2005, 15). පසුකාලීන සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් රුවන්වැලි

---

[22] කිඤ්චික්ඛ පාසාණ යන්න උගතුන්ගේ විමසුමට භාජනය වූ වදනකි. පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ රුවන්වැලි පේසාවේ සිට අඩි 25ක් පමණ පිටට විහිදෙන සීමාවේ කරවූ ගල් ඇතිරුමක් බවයි (2005, 56). මොහුගේ මෙම මතය සඳහා වංසත්ථප්පකාසිනියේ අර්ථගැනවීම (1994, 510) බෙහෙවින් හේතු වී ඇත. ඒ.ඇස්. හෙට්ටිආරච්චි මහතා ද පරණවිතාන අදහසට එකඟතාවක් පළකර ඇතැයි සිතේ (හෙට්ටිආරච්චි 2009:42). කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ මතය නම් මෙය පේසාව හා සලපතල මළුව වෙන් කරන සීමාවේ වූ වැලි කොන්ද විය හැකි බව යි (එම., 2009:43).

[23] මේ නම් පෙර පෙර භාතිකාභය රජු විසින් කරවූ පිළිකඩ දෙකම විය යුතු ය. පරණවිතානයන් පෙන්වා දෙන අකාරයට මේවා මුලින් නිර්මාණය කර තිබුනේ දැවයෙන් විය යුතුය. එනිසා මුල් පාලකයා නිර්මාණය කර කෙටි කලෙකින් ම නැවත ඒවා නිර්මාණය කිරීමට සිදු වී ඇත (පරණවිතාන, 2005, 57). මන් ද මේ දෙදෙනා පිළිබඳව ම පැවසීමේ දී පෙන්වා දෙන්නේ ඒවා නිර්මාණය කළ බවකි.

[24] ස්තූපයට සෙන නොවනදින්නට මේ නිර්මාණය සිදු කරන ලද බව වංසත්ථප්පකාසිනිය (1994, 538), පරණවිතාන මහතා (2005, 32) හා හෙට්ටිආරච්චි මහතා (2009, 45) විසින් ද පෙන්වා දෙයි.

[25] මෙම වචනයෙහි අර්ථය සම්බන්ධයෙන් විද්වතුන්ට මෙතෙක් නිශ්චිත අදහසක් නොමැත.

ස්තූපයෙන් මෙම හත්පීවේදිය විතැන් වී ඇති මුත් ස්මිදර් විසින් මෙය සැළසුම් ද සහිතව (සැළසුම 03) වාර්තාකර තිබේ (1993, plate XXVII). පළමුවැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව.575-608) විසින් රුවන්වැලි සෑයෙහි රන්මුවා ඡත්‍රයක් කරවූ බව මහවංසය පෙන්වා දෙයි (41:33-34). දෙවන කාශ්‍යප රජු (ක්‍රි.ව. 650-659) විසින් ද මල්වතු, පොල්වතු හා වැව් කරවා මේ ප්‍රධාන ස්තූප තුනට පූජා කර තිබේ (මව., 42:145-146). මීට අමතරව සිලාමේඝවණ්ණ රජු (ක්‍රි.ව. 623-632) හා පළමුවැනි දප්පුල රජු (ක්‍රි.ව. 659) විසින් මහා ථූපයට සත්කාර කළ බව පමණක් මහාවංසය සඳහන් කරයි (මව., 42:65; 46:121-122).

## 02. මධ්‍යකාලීන ඉතිහාසය (වර්ෂ 1029 සිට 1815 දක්වා කාලය)

රුවන්වැලි ස්තූපය ඉදිකරන ලද අනුරාධපුර අවධිය තරම් මධ්‍යකාලීන අවධියේ දී ඒ පිළිබඳ අවධානයක් යොමු කළ බවක් හඳුනා ගත නොහැක. ඊට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ අනුරාධපුරයෙන් ඉවත් වූ රාජධානිය නිරිත දෙස කලාපවල ස්ථාපිත වීම විය හැකි ය. රජුගේ ප්‍රධාන සහයෝගය නොමැතිව රුවන්වැලි ස්තූපය තරම් සුවිසල් වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීමක් සුරක්ෂිත කිරීම හෝ නඩත්තුව කෙරෙහි යොමු වීම මහත් අභියෝගකර කාර්යයක් වූ බැවින් මේ සම්බන්ධයෙන් අවම මැදිහත්වීමක් හඳුනා ගත හැකි ය. ප්‍රධාන වශයෙන් මෙරට පැවති දේශපාලනික ව්‍යාකූලතා හා විදේශීය බලපෑම් හේතුවෙන් ඉන් පෙර ඉදිකරන ලද ස්මාරක නඩත්තුව කෙරෙහි අවධානය යොමු කරන්නට ද පවා පාලකයන්ට අවස්ථාවක් නොවීය.

දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ අස්ථාවර භාවයට පත් අනුරාධපුර නගරය නැවත ස්ථාවර වන්නේ පොළොන්නරු අවධියේ දී ය. මෙහි පුරෝගාමීත්වය ගත් පළමු විජයබාහු (ක්‍රි.ව. 1055 - 1110) රජු විසින් අනුරාධපුරයෙහි දී අභිෂේකය පැවැත්වූ නමුදු රාජධානිය පොළොන්නරුවට ගෙන යෑමෙන් පසු අනුරාධපුරයේ ස්තූප සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කළ බවක් වංසකතාව පෙන්වා නොදෙයි. අනුරාධපුරයේ මහා ස්තූප සම්බන්ධයෙන් අවධානය යොමු කරන පාලකයා ලෙසින් වංසකතාව ඉදිරිපත් කරන්නේ පළමු පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) ය. අස්වාමික හෙයින් වගවලසුන් හා දිවියන්ගේ ලැගුම්හල් වූ අනුරාධපුරයේ මහාවිහාර ආශ්‍රිත ස්තූප කෙරෙහි රජුගේ ප්‍රමුඛ අවධානය යොමු ව තිබේ. එහි දී දෙමළුන්[26] හා වෙනත් කර්මාන්ත ශිල්පීන් යොදවා ගනිමින් මේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ අතර, එම කටයුතු නිරීක්ෂණය සඳහා වෙනම අමාත්‍යවරුන් ද පත් කර ඇත (එම., 104-106). දාගැබ 120 රියනක් උස් කොට බඳවා සුනු පිරියම් කළ බව පැහැදිලිවම දක්වා තිබේ. හාත්පස භූමි

[26] "දෙමළුන් විසින් පූර්වයෙහි බිඳිනාලද ලක්දිවිහි සියලු සෑ උන් ලවාම කරවිය යුතුය" යි සිතා ලංකාධිපති විසින් ඇණවූ කල සමහරුන් ලක්දිවට පමුණුවා රුවන්වැලි සෑයෙහි කර්මාන්ත කරවීය (මව., 104-106).

ප්‍රදේශය ද මනා ලෙස ශුද්ධ පවිත්‍ර කරවා සමස්ත ප්‍රතිසංස්කරණ කටයුතු හමාර කිරීමෙන් පසු ලංකාවේ විවිධ දෙසින් වැඩම කරවන ලද භික්ෂූන් වහන්සේලා පෙරටු කොට ගෙන රජු විසින් සෑයේ කොත පැළඳවීම උත්සවාකාරයෙන් සිදු කොට ඇත (එම.,76:104-122).

පොළොන්නරුව අවධියේ අවසාන කාලයේ බලයට පත් නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව. 1187 - 1196) විසින් රුවන්වැලි ස්තූපය වෙනුවෙන් මහාපරිමාණ පූජාවන් සිදු කළ බව පෙන්වා දෙන පොළොන්නරුව ගල්පොත පුවරු ලිපිය (EZ., II, 1985, 106-107) එතුමාගේ ධනයෙන් ලක්ෂ තිස් හතක් වියදම් කර (සතිස්ලක්ෂයක් ධන වියදම් කොටැ.....) පූජා කරවූ බව පෙන්වා දෙයි. මේ මුදල් වැය කලේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ද නො එසේ නම් එහි වැඩිදියුණුව වෙනුවෙන් ද යන්න නිශ්චිතව ශිලා ලේඛනයෙහි නොදක්වයි. තව ද එම ලිපියෙහි දක්වන්නේ පූජා පවත්වා ආශිර්වාද කළ තැන ශිලාමය දාගැබක් කරවූ බවයි (EZ., II, 1985, 107). බොහෝ දුරට මෙය රුවන්වැලි ස්තූප මළුවේ ඇති ශිලාමය කුඩා ස්තූපය විය හැකි ය. මෙම ප්‍රධාන පාලකයන් දෙදෙනා හැරෙන්නට පොළොන්නරු අවධියේ වෙනත් කිසිදු පාලකයෙක් රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කළ බවක් සඳහන් නොවේ.

රාජධානි නිරිත දෙසට සංක්‍රමණය වෙත් ම අවධානයෙන් තොර වූ අනුරාධපුරයේ ස්තූප වැඩි අවධානම් තත්ත්වයකට මුහුණ දෙන්නට විය. මෙම වාතාවරණය මදකට හෝ සමනය කිරීමේ මූලිකත්වය ගත් පාලකයන් දෙදෙනෙක් ලෙස දඹදෙණි රජධානි අවධියේ දෙවන පරාක්‍රමබාහු (පණ්ඩිත පරාක්‍රමබාහු) රජු (ක්‍රි.ව. 1236-1270) හා සිව්වන විජයබාහු (බෝසත් විජයබාහු) රජු (ක්‍රි.ව. 1270-1272) පෙන්වා දිය හැකි ය. දෙවන පරාක්‍රමබාහු රජු විසින් රජරට කලාපය විලෝපනය කිරීමෙහි නිරතව සිටි මාඝ (ක්‍රි.ව. 1215-1236) පලවා හැරීමෙන් පසු රුවන්වැලි ස්තූපය ආදී ආගමික ස්ථාන පිළිසකර කිරීම් කටයුතුවල නිරත වූ බව ප්‍රකාශිත ය (කුලතුංග, 2011, 13). සිව්වන විජයබාහු රජු තම පියා විසින් අරඹා අවසන් කොට නොතිබූ මෙම ප්‍රතිසංස්කරණ කටයුතු යළි පණගන්වා ගනිමින් එම කාර්යය සඳහා යොමු වී සිටි කර්මාන්ත ශිල්පී කණ්ඩායම් නැවත ක්‍රියාත්මක කරවීය (මව., 88:83-88). ඉන් අනතුරුව සමයේ කිසිදු පාලකයෙක් රුවන්වැලි ස්තූපයේ වැඩිදියුණුව වෙනුවෙන් කටයුතු කළ බවක් මූලාශ්‍රයෙහි සඳහන් නොවේ. නැවත වතාවක් අනුරාධපුර රුවන්වැලි ස්තූපයේ වැඩිදියුණුව වෙනුවෙන් සිදු කරන ලද කටයුතු පිළිබඳව සාකච්ඡා වන්නේ බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණීමෙන් අනතුරුව කාල පරිච්ඡේදයේ දී ය.

## 03. මැතකාලීන ඉතිහාසය

### 03.1. මැත කාලීන ඉතිහාසයේ ප්‍රාරම්භක අවධිය (1815-1890 දක්වා) හෙවත් මුල් මැත ඉතිහාසය

මෙම කාලසීමාවේ දී අනුරාධපුරයේ ස්වභාවය පිළිබඳව තොරතුරු සපයන බ්‍රිතාන්‍ය ජාතිකයන් කිහිපදෙනෙකි. ලංකාවේ හමුදාවේ මේජර් ජෝන් ඩේවි' විසින් 1818 දී විස්තර කරන්නේ එසමය වන විට අනුරාධපුර ශුද්ධ භූමිය නටබුන්ව පැවති ආකාරයයි (හරිස්චන්ද්‍ර, 2001, 294-295). 1834 දී ආර්.ඩබ්. හෝර්ටන් ආණ්ඩුකාරවරයා සමග අනුරාධපුරය බලා ගිය මේජර් තෝමස් ස්කිනර් පෙන්වා දෙන්නේ ශ්‍රීමහා බෝධි වන්දනා කිරීමපිණිස මහනුවර සිට මාතලය හා දඹුල්ල හරහා මිනිසුන් පැමිණි බවත්, පුරාණ අනුරාධපුර පූජනීය භූමිය මනුෂ්‍යයන්ගෙන් පිරී පැවති බවත් ය (එම).

1815න් පසු ස්ථිර අයිතියෙන් හෝ පරිභෝජනයෙන් තොරව පැවති ඉඩම්වල අයිතිය 1840 අංක 12 දරන මුඩු බිම් පනත අනුව රජයට පවරා ගැනීමේ දී අනුරාධපුරයේ බොහොමයක් පූජනීය කලාප ඊට ලක් විය. අනුරාධපුරයේ නිතර ජනයා ගැවසෙන ස්ථාන හැර සෙසු සියලු ඉඩම් රජයට පවරා ගැනීම මෙම පනතේ විධිවිධාන අනුව සිදු විය. මහා ස්තූප ආශ්‍රිත විහාරාරාමයන්හි ඉඩම් බොහෝ ප්‍රමාණයක් ද මේ පනත යටතේ රජයට නතු කර ගැනීම මත ආරාම භාරකාර හිමිවරුන් හා රජය අතර නිතර ගැටුම්කාරී තත්ත්වයන් ද වර්ධනය වී තිබේ. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා විසින් 1870 දශකය වන විට සමස්ත අනුරාධපුර පුදබිමේ තත්ත්වය පිළිබඳව තත්කාලීන විස්තරයක් සිදු කරයි. ඒ අනුව,

> "1869 තරමේ දී පවා අනුරාධපුර නගරයේ දක්නට ලැබුනේ පන්සල් දෙකකි. ඒ උඩමළුව සහ රුවන්වැලි සෑය යන පන්සල් දෙක ය. අනුරාධපුරයේ අනෙක් පූජනීය ස්ථානවල භික්ෂූ වාසයක් නොවී ය. ............... වන්දනාකරුවෝ අඩි පාරවල් වැනි පටු මං ඔස්සේ වටවන්දනාවේ ගිය හ. එළිපෙහෙළිව තිබුනේ එවකට ආණ්ඩුවේ ගොඩනැගිලි, වෙළඳසැල්, ආණ්ඩුවේ නිළධාරීන්ගේ නිවාස ආදිය පිහිටුවා තිබුණු ශ්‍රීමහා බෝධිය සහ රුවන්වැලි සෑය අසළ ප්‍රදේශය පමණි" (කරුණානන්ද, 2003, 13).

ජන ශූන්‍ය අනුරාධපුරයේ තත්ත්වය එබඳු විය. බ්‍රිතාන්‍යයන් විසින් මේ තත්ත්වය තමන්ට වාසිදායක අන්දමින් වෙනස් කළ යුතු ය යන ස්ථාවරයේ සිටියේ ය. නමුත් වලිසිංහ හරිස්චන්ද්‍ර වැනි සිංහල බලවේග එම වෙනස් කිරීම්වලට ලක් වන අතීත උරුමය ආරක්ෂා කිරීමේ පදනමක සිටියේ ය. ඒ හැරෙන්නට බෞද්ධ උරුමය ද, බැතිමතුන්ගේ අපේක්ෂාවන් ද ආරක්ෂා වන මට්ටමින් එම වෙනස් කිරීම් සිදු විය යුතු ය යන ස්ථාවරයේ සිටියේ ය. මේ ද්වි

පාර්ශ්වීය විරසකභාවයන් ආගමික මතභේදයන් බවට ද පත් වීම ස්වභාවික ය. එනයින්, බෞද්ධ පූජනීය කලාපයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු සිදු කිරීමේ හා වෙනත් ආයතනික ගොඩනැගිලි ඉදි කිරීමේ තත්ත්වයන් පාලනය කිරීමට ද ඉංග්‍රීසීන්ට සිදු විය.

වලිසිංහ හරිස්චන්ද්‍ර මහතාගේ බෞද්ධ පුනර්ජීවන කටයුතු ඉක්මන් නොවීම සඳහා අනුරාධපුරයේ බෞද්ධ ජනතාව සීමිත වීම ද බලපාන ලද බව සැලකිය හැකිය. 1871 වර්ෂය වන විට අනුරාධපුරයේ බෞද්ධ ජනගහනය 196ක් වැනි සුළු ප්‍රමාණයක් විය. නමුත් 1901 වර්ෂයේ බෞද්ධ ආරක්ෂක කමිටු පිහිටුවීම හා වෙනත් පුනර්ජීවන කටයුතු හේතුවෙන් එම වර්ෂය වන විට බෞද්ධ ජනගහනය 1210ක පමණ ප්‍රමාණයක් වී ඇතැයි ගණනය කර තිබේ (කුලතුංග, 2014, 56).

ආගමික වශයෙන් යම් අර්බුධකාරී තත්ත්වයක් පැවතිය ද අනුරාධපුරයේ නටඹුන් විධිමත් ලෙස වාර්තාකරණය කිරීමට බ්‍රිතාන්‍ය යටත්විජිත රජය අවශ්‍ය කටයුතු යොදන ලදී. ස්මිදර්ගේ "ආකිටෙක්චරල් රිමේයින්ස් ඔෆ් අනුරාධපුර, ශ්‍රී ලංකා" (Architectural Remains of Anuradhapura, Sri Lanka - 1894) කෘතිය සම්පාදනය කිරීම සඳහා මෙහෙයවීම් සිදු කරන ලද්දේ ජේ. පර්ගියුසන් විසිනි (කරුණාරත්න, 1990, 3). ස්මිදර් විසින් මෙම ස්තූපයේ සියලු කොටස් පිළිබඳව සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කරයි. ඔහුගේ වාචික විස්තරයට අමතරව සැලසුම් මගින් සිදු කරන විස්තර කිරීම් රුවන්වැලි ස්තූපයේ තත් ස්වභාවය පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමකි. දිග, පළල, උස, නිර්මාණය කර ඇති මාධ්‍යය යනාදිය පිළිබඳව ද ඔහු විසින් වාර්තා කරයි (Smither, 1993, 35).

හර්කියුලිස් රොබින්සන් (Hercules Robinson - 1865-1872) ආණ්ඩුකාරවරයාගේ කාලසීමාවේ දී අනුරාධපුරයේ වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ සංරක්ෂණය සඳහා යොමු වීම සම්බන්ධයෙන් පත් කිරීම් කිහිපයක් ම සිදු කරන ලද බව සඳහන් වේ. ඒ.බී. ෆියර්ස් (A.B. Fyres) ජේ.ජී. ස්මිදර් (J.G. Smither) දෙදෙනා මෙහි දී ප්‍රධාන විය (Godakumbura, 1969, 13). ඒ හැරෙන්නට සර් හර්කියුලිස් රොබින්සන් විසින් ස්වකීය අවසන් නිළ කාලයේ දී අනුරාධපුරයෙහි ප්‍රධාන ස්මාරකවල ඡායාරූප ලබා ගැනීම සඳහා ලෝටන් යොමු කරයි (කරුණාරත්න 1990:3). 1873 දී විලියම් ග්‍රෙගරි (William Gregory) ආණ්ඩුකාරවරයාගේ නියමය පරිදි පුරාණ අනුරාධපුරය සම්බන්ධයෙන් එතෙක් දැන සිටි සියලු දේ ජෝජ් කැපර් (George Capper) නමැති මිනින්දෝරු තැන විසින් ඒකරාශී කරන ලද බවත් විශේෂයෙන් මහා ස්තූපයන් හි උස සහ වෙනත් මිමි සම්බන්ධයෙන් හෙතෙම අවධානය යොමු කළ බවත් සඳහන් වේ (Godakumbura, 1969, 14; බෙල්, 2005, xi).

1856 අංක 10 දරන විහාර හා දේවාල ගම් පනත අනුව අටමස්ථානයට අයිති භූමිය වෙන් කර දීමට ඉංග්‍රීසීන් විසින් කටයුතු කරන ලදී. සෙසු ඉඩම්

සියල්ලක් රජයට පවාරාගෙන ඇත. මෙසේ පවරා ගන්නා ලද ඉඩම් වර්තමානය වන විටත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පවතී (කුලතුංග, 2014, 49). දිගින් දිගටම බ්‍රිතාන්‍යයන්ගේ කටයුතුවලට අභියෝගයක් වන අයුරින් සිංහල බලවේග නැගී සිටීමත්, ප්‍රතික්‍රියා දැක්වීමත් මත මෙසේ සිදු කරන්නට ඇතැයි කල්පනා කිරීම සහේතුක ය. 1872 නොවැම්බර් 20 දින අංක 88737 දරන ඔප්පුවෙන් අටමස්ථානාධිපති හිමියන් වෙත අටමස්ථානයට අයත් භූමිය පවරා දී තිබේ. මෙසේ අක්කර 43 රූඩ් 02 පර්චස් 02ක් වන භූමිය අටමස්ථාන අයිතියට පවරා දුන් බව ප්‍රකාශිත ය. ජේතවනාරාමය, ලංකාරමය, ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය, රුවන්වැලි සෑය, බෝමලුව හා ලෝවාමහාපාය යන භූමි පරිශ්‍රයන් නිශ්චිත වශයෙන් වෙන් කර දීමක් සිදු කොට තිබේ (කරුණානන්ද, 2003, 13). පෙර පටන් බෞද්ධ සිද්ධස්ථාන සතු යයි බෞද්ධයන් විශ්වාස කළ ඉඩකඩම් අහිමි වී ඇතැයි ප්‍රායෝගිකව අවබෝධ කරගෙන ඇත්තේ 1873 වර්ෂයේ දී උතුරු මැද පළාත පිහිටුවා ලෞකික ගොඩනැගිලි බොහොමයක් එම පූජනීය කලාපයේ ඉදි කරවීමට කටයුතු කිරීමෙන් අනතුරුවයි (කරුණානන්ද, 1993, 13). අතීතයේ මේ සියලු කලාපයන් පූජා නගරයක් ලෙස පැවති හෙයින් ඒවා කෙරෙහි බැතිමතුන්ගේ ක්‍රියාකලාපයන් අක්කර 43කට පටු කිරීමත් සමග ඊට විරුද්ධව බෞද්ධ බලවේගවල ක්‍රියාකාරකම් උග්‍ර අතට හැරෙන්නට විය. මේ කාලසීමාව වන විට බ්‍රිතාන්‍ය ආණ්ඩුව සම්බන්ධයෙන් සිංහල බෞද්ධයන්ගේ අප්‍රසාදය දිනෙන් දින වර්ධනය වී ඇතැයි කරුණානන්ද මහතා පෙන්වා දෙයි (එම).

සමස්ත අනුරාධපුරයේ එවක පැවති මෙවන් වාතාවරණයක් තුළ ඉංග්‍රීසීන්ගෙන් මෙරට උරුම සුරක්ෂාව සම්බන්ධයෙන් වැඩිමනක් බලාපොරොත්තු රඳවා ගැනීම ප්‍රතිඵල විරහිත අපේක්ෂාවකි. නමුත් මෙසමයෙහි ද යම් යම් මැදිහත් වීම් රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් සිදුකර ඇති බව හඳුනා ගත හැකි විය.

'අයිවර්ස්' නම් ඒජන්තවරයා විසින් 1853 දී විශාල පින්කමක් කරවා රුවන්වැලි දාගැබ සුදු වස්ත්‍රවලින් වසන ලදි. එහිදී පැමිණි වන්දනාකාර සමූහයා විසින් දාගැබට පිත්තල හෝ තඹ කොතක් පළඳවන ලදි (කුලතුංග, 2001, 41). මේ කාලයේදී ම නාරංවිට සුමනසාර ස්වාමීන් වහන්සේ[27] රුවන්වැලි ස්තූපය පිළිසකර කරවීමේ කටයුතු මහත් ඕනෑකමින් සිදු කරන්නට යොමු වී සිටියේ ය. එවකට රුවන්වැලි ස්තූපයේ භාරකාරත්වය පැවතියේ සියම් නිකායික හිමිවරුන් වෙතය. රාමඤ්ඤ නිකායේ පැවිදිව සිටි නාරංවිට සුමනසාර

---

[27] හේන්රි පාකර් විසින් මේ මෙම හිමි නම නාමිකව නොදක්වන නමුත් උන් වහන්සේගේ කැපවීම පිළිබඳව "අධිෂ්ඨානශීලී තරුණ බෞද්ධ හිමි නමක් විසින් වසරකට වරක් එළඹෙන උත්සව සමයෙහිදීත් අනෙකුත් ආගමික උත්සව සඳහාත් අනුරාධපුරයට පැමිණෙන බැතිමතුන්ගේ ආධාරවලින් 1873 මුල් භාගයේ දී දාගබ ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කරන ලද නමුත් කටයුත්තෙහි ප්‍රගතිය මන්දගාමී ය" යනුවෙන් තබන සටහන මෙහි දී ඉතා වැදගත් වේ. කාර්යයෙහි ප්‍රගතිය කවර ලෙසකින් නමුත්, කැපවීම පාකර්ගේ ප්‍රශංසාවට ලක් වී තිබේ (පාකර්, 2008, 343).

හිමියන්ට රුවන්වැලි ස්තූපයේ කටයුතු සිදු කරන්නට ප්‍රථමයෙන් සියම් නිකායේ පැවිද්ද ලබා ගැනීමට ද සිදු වී තිබේ (කුලතුංග, 2011, 41). අටමස්ථානාධිපති හිමියන්ගෙන් එම කටයුතු සඳහා අවසරය ලැබී ඇත්තේ ඉන් අනතුරුව ය. එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා උන්වහන්සේට නවාතැන් ගැනීමට හෝ ස්ථානයෙක් නොවූයෙන් සෑ මළුවෙහි එක් තැනෙක බරකරත්ත අඹරාවක් පිහිටුවා එහි නැවතී වැඩ කටයුතු ආරම්භ කර තිබේ. කෙසේ නමුත් එම කැපවීමේ මල්ඵල දරා අවුරුදු පතා දහස් ගණනක් බැතිමතුන්ගේ නොමඳ සහයෝගයෙන් සෑයේ යම් ප්‍රමාණයක් ද ඉන් නැගෙනහිර පාර්ශ්වයේ විහාර ගෙය ද ස්තූපයට සම්බන්ධ තවත් ගොඩනැගිලි කිහිපයක් ද පිළිසකර කරවා ගැනීමට සුමනසාර ස්වාමීන් වහන්සේට හැකි වී ඇත (හරිස්චන්ද්‍ර, 2001, 155; Godakumbura, 1969, 21). තව ද එවක ආණ්ඩුකාර ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ගේ සරදමට (අභයසුන්දර, 2013, 66) ද විටෙක නොමඳ ප්‍රශංසාවටද මෙම ස්තූප ප්‍රතිසංස්කරණ කාර්යයන් පත් වූ බව පෙනේ (එම., 67; හරිස්චන්ද්‍ර, 2001, 155-156). අවසානයේ නාරංවිට සුමනසාර හිමියන් මේ මහත් අභියෝගකර කාර්යය සිදු කරමින් යන විට දෙවන වර අනුරාධපුරයට පැමිණි ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා ඒ වෙනුවෙන් සන්තෝෂයට පත්ව නව කර්මාන්ත සඳහා රන් පවුම් සියයක් පරිත්‍යාග කර තිබේ (අභයසුන්දර, 2013, 67). තව ද සුමනසාර හිමියන්ගේ නොපසුබට උත්සාහය ඇගයීමට ලක් කොට හෙතෙම අත් ලියවිල්ලක් ද උන් වහන්සේ වෙත ලබා දී ඇත.

> "....රුවන්වැලි දාගැබ වෙත පැමිණියෙමි. එම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නාරංවිට සුමනසාර උන්වහන්සේ විසින් කරවා තිබෙන වැඩ ප්‍රමාණය දැන අතිශයින් පුදුම වීමි. වර්ෂ 3කට ප්‍රථම එය ගඩොල් ගොඩැල්ලක් මෙන් පෙනිණි. දැන් වනාහි එහි කැලේ එළි කර තුන්මාල් පේසාවේ වැඩි කොටසක් අලුත් වැඩියා කර තිබේ. නාරංවිට සුමනසාර උන්වහන්සේගේ දැඩිතර වීර්යය ලක්වැසි ස්වදේශ සමූහයා උතුම් කොට සලකා උන්වහන්සේට ආධාර දෙනවා ඇතැයි මම විශ්වාස කරමි. මෙම වැඩේට මම සම්මාදම් දුනිමි. එසේ කලේ ආගමානුකූල ගොඩනැගිල්ලක් හැටියට සලකාගෙන නොව (සිංහල) ජාතිය සිහිපත් වීමට හේතු වූ අනගි ගොඩනැගිල්ලක් මෙන් සලකාගෙන බව දත යුතුයි." (එම, 67)

හෙන්රි පාකර් විසින් 1885 කාලය වන විට රුවන්වැලි ස්තූපය පැවති ආකාරය පිළිබඳව විස්තරයක් සපයයි. සුමනසාර හිමියන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස රුවන්වැලි ස්තූපයේ ඉහළින් ගරා වැටුන කොටස් පාදම් ප්‍රදේශය සිසාරා පැතිර තිබිය දී ඒවා ඉවත් කිරීමේ කටයුතු දියත් කෙරුණත්, රැකුල් දී තිබූ කොටස් ඉවත් වීමෙන් අස්ථාවර වූ ස්තූපයේ දකුණු පැත්තෙන් තවත් පදාසයක් ඇද හැළුණ බව පෙන්වා දෙයි (පාකර්, 2008, 343).

> "1886 නත්තල් සමයෙහි එහි ගිය මම ගඩොල් ගැල වී හැළී තිබුණු කොටසෙහි, අඩි 19 අඟල් 11 ½ ක් දාගබට ඇතුළතින් කපරාරු නොකළ තවත් දාගබක් තිබෙන බව දැකීමෙන් විශ්මයට පත් වුනෙමි. ගැලවී හැළී තිබූයේ පිටතින් වූ ආවරණය පමණක් වූ අතර, පැදී තිබුනු සෑම තැනකින් ම ඇතුළත වූ දාගැබ නිරාවරණය වී තිබුනේ ය. .................. ඊට ඇතුළතින් තවත් කුඩා දාගබක් ද ඇති බව ජනප්‍රවාදයෙහි පවත්නා නමුත් එවැන්නක් සනාථ කෙරෙන සාක්ෂි ඉතිහාසයෙහි සඳහන් නොවේ (එම., 344)."

මෙම ප්‍රකාශයට අනුව රුවන්වැලි ස්තූපයේ අභ්‍යන්තරය සම්බන්ධයෙන් මත දෙකක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

01. ස්තූපය ඉදිකිරීමෙන් පසු අවස්ථාවන්හි දී විශාල කිරීම්වලට ලක් වී ඇති බවයි. එය එසේ වී නම්, එබඳු අවස්ථාවන් හි දී මුල් රූපයට හානි නොවන ලෙසෙ පසු විශාල කිරීම් සිදු කොට තිබෙන සෙයක් ද හඳුනා ගත හැකි ය. බොහෝ දුරට මූලාශ්‍රයන් හි සඳහන් කංචුක නිර්මාණය මේ ආකාර වූ වැස්මක් වීමට ද ඉඩ තිබේ.

02. ජේතවන, අභයගිරි ස්තූප ගර්භ අභ්‍යන්තරය නිර්මාණය කිරීමේ දී සමාන්තර බිත්ති බැඳීමෙන් හෝ කාමර වැනි කොටස් නිර්මාණය කිරීමෙන් පස් හා ගඩොල්කැබලි ආදිය දමා ඒවා පුරවා එම කොටස් ආවරණය කර ගැනීම සිදු කොට තිබේ. මෙය මහා ස්තූප බැඳීමේ උපක්‍රමයක් වූ බැවින් රුවන්වැලි ස්තූපයේ ද මෙබඳු අභ්‍යන්තර බිත්ති පැවතිය හැකි වීමත්, මෙය එබඳු අභ්‍යන්තර බිත්තියක් වීමට හැකි වීමත් ය.

### 03.2. මෑත කාලීන ඉතිහාසයේ ද්විතීයික අවධිය (1890-1980 දක්වා) හෙවත් මධ්‍ය මෑත ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමත් සමග පුරාවිද්‍යා කටයුතුවල ක්‍රමවත් බවක් විෂද කරන්නට විය. 1890-1912 දක්වා එච්.සී.පී. බෙල් ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස කටයුතු කරන අතර, ඔහුගේ විශ්‍රාම ගැනීමෙන් අනතුරුව 1912 දී ඊ.ආර්. අයර්ටන් එම ධූරයට පත් විය. ඉන් අනතුරුව ඒ.එම්. හොකාර්ට්,ඩී.එල්. වින්සර්, පියර්සන්, ලෝංහර්ට්ස් වැනි බ්‍රිතාන්‍ය නිලධාරීන් ද 1940 දී ප්‍රථම දේශීය පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස සෙනරත් පරණවිතාන ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු කර ඇත (කුලතුංග, 2014, 61).

එතෙක් යුරෝපීය නිළධාරීන් යටතේ පැවති බෞද්ධ ස්මාරක ඇතැම් විට විනාශ වීමට ද තවත් විටෙක සුරක්ෂිත වීමට ද යටත්විජිතකරණයම හේතු වූ බවක් ද හඳුනා ගත හැකි ය. කවර ලෙසකින් හෝ පුරාවිද්‍යා සමීක්ෂණ ආයතනය ආරම්භ වන 1890 කාලය වන විට අනුරාධපුරයේ මහාස්තූප පෙරටු කොට ගත් ස්මාරක පරිශ්‍ර පැවතියේ කැළෑවෙන් වැසී ගොස් ය. ඒ තත්ත්වය හමුවේ මුල්ම පුරාවිද්‍යා කොමසාරිස් ධූරයට පත් එච්.සී.පී. බෙල් මහතාගේ ප්‍රථම කාර්යය වූයේ ඝණ කැලෑව එළි පෙහෙළි කිරීමයි.

මෙසේ එක් පාර්ශ්වයකින් පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදියුණු වෙත්ම, අනෙක් පාර්ශ්වයෙන් හෙළ බෞද්ධ පුනර්ජීවන කණ්ඩායම්වල නැගීමක් ද සිදු වෙයි. විශේෂයෙන් ඒවායෙහි මූලිකත්වය ගත්තේ වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය. ඒ අනුරව අනුරාධපුර පූජනීය කලාපයේ සිදුවන බොහෝ පුරාවිද්‍යා කටයුතු සමීක්ෂණය කිරීමත්, උරුමයන් කෙරෙහි අවදානම් සහගත කටයුතු බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයින් හා වෙනත් රජයේ නියෝජිතයන් අතින් සිදු වන විට ඒවාට විරුද්ධව නැගී සිටීමත් ඔහුගේ මූලිකත්වයෙන් සිදු විය. ඔහු මුලින්ම අනුරාධපුර පූජනීය නගරය (The Sacred City of Anuradhapura) නමින් රචනා කරන ලද කෘතිය ඔස්සේ අනුරාධපුරයේ අනන්‍යතාවන් පිළිබඳව දේශීය මෙන්ම බ්‍රිතාන්‍ය විද්වතුන්ගේ අවධානය ද යොමු කරවා තිබේ (Godakumbura, 1969, 21). බ්‍රිතාන්‍ය පාලනය යටතේ බෞද්ධයන් වෙතින් ගිලිහී ගිය ඔවුන්ගේ වරප්‍රසාද නැවත වතාවක් හිමිකර දීම සඳහා මූලිකත්වය ගත් හරිස්චන්ද්‍ර මහතා බෞද්ධ ව්‍යාපාරයේ පෙරමුණ ගෙන කටයුතු කලේ ය. මේ කාලසීමාවේ දී ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අනුරාධපුර පූජා නගරයෙන් හැකි උපරිම ප්‍රමාණයක් තමන් සන්තක කර ගැනීමට වෑයම් කළ අතර, සිංහල බෞද්ධයන් පැරණි පූජනීය කලාපය සුරක්ෂිත කර ගැනීමට උත්සාහ දැරීය. හැකි සෑම අවස්තාවක දී ම ඉංග්‍රීසීන් මුණගැසී කරුණු ඉදිරිපත් කළ හරිස්චන්ද්‍ර මහතා, එසේ නොහැකි අවස්තාවන් හි දී පෙත්සම් මගින් හෝ කරුණු දැක්වීම සිදු කරන ලදි. එංගලන්ත රජු වෙත පෙත්සම් යැවීම ඵල රහිත බව තේරුම් ගත් ඒ මහතා, වරෙක බෞද්ධයාගේ දුක්ගැනවිලි පිළිබඳව කෘතියක් ලියා එය තෑග්ගක් වශයෙන් එංගලන්ත රජු වෙත යැවීමට කටයුතු කලේ ය (අභයසුන්දර, 2013, 48). අනුරාධපුර ශුද්ධ නගරය බේරා ගැනීම සම්බන්ධයෙන් උද්‍යෝගිමත් මෙහෙවරක් දියත් කළ බෞද්ධ පුනර්ජීවන වැඩපිළිවෙල හේතුවෙන් වලිසිංහ හරිස්චන්ද්‍රතුමා දුටුගැමුණු පුනරාවතාරය ලෙස ද ඇතැමුන් හඳුන්වා ඇත (අභයසුන්දර, 2013, 48).

මේ කාලසීමාවේ දී රුවන්වැලි ස්තූපයේ සංරක්ෂණ කටයුතු ස්ථිර පදනමක් යටතේ සිදු කිරීමේ පරමාර්ථයෙන් ඒ සඳහා ද මූලිකත්වය ගැනීමට හරිස්චන්ද්‍ර මහතා කටයුතු කලේ ය. ඒ අනුව රුවන්වැලි මහ සෑ මළුවේ ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වූ එතුමා රුවන්වැලි චෛත්‍යවර්ධන සමිතිය ආරම්භ කිරීමට යෝජනා කලේ ය. මෙසේ චෛත්‍යවර්ධන සමාගම පිහිටුවා නාරංවිට සුමනසාර

හිමියන්ට එහි අනුශාසක පදවිය පිරිණැමීය. සභාපති ධූරය ඔහු විසින් ම පිළිගත්තේ ය (අභයසුන්දර, 2013, 65). චෛත්‍ය වර්ධන සමිතිය පිහිටුවීමෙන් අනතුරුව ලංකාව පුරා යමින් දේශන පවත්වා ස්තූපය පිළිසකර කිරීමේ කටයුතු සඳහා ප්‍රාග්ධනය රැස් කිරීමේ කාර්යයෙහි ඔහු නිරත වී තිබේ. 1879 වර්ෂය දරන තඹ තහඩු ලිපියක් විලච්චිය කෝරලයේ පාලුගොඩ උපාසකරාල නමැත්තෙකු විසින් රුවන්වැලි ස්තූප පේසාවේ තබා තිබීමෙන් ද, තවත් ලිපියක් තඹ තහඩුවක සටහන් කර බු.ව. 2455 (1912) යනුවෙන් වර්ෂය ද ඇතුළත් ව පානදුරේ මාරියා සොයිසා නමැති අයෙකු විසින් කෙටුම්පත් කර තිබීමෙන් ද (හෙට්ටිආරච්චි, 2009, 53-54) ලංකාව පුරා ගොස් හරිස්චන්ද්‍ර මහතා දේශන පැවැත්වීම හේතුවෙන් බෞද්ධ ජනතාව ඊට ප්‍රතිචාර වශයෙන් රුවන්වැලි ස්තූපය පිළිසකර කිරීම වෙනුවෙන් දායකත්වයන් සැපයූ ආකාරය පසක් වේ.

අඛණ්ඩව මැදිහත්වීම් සිදු වෙමින් පැවති රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් විටින් විට මේ යුගයේ දී අසන්නට ලැබේ. එසේ නාරංවිට ස්වාමීන් වහන්සේ ඇතැම් පුද්ගලයන්ට රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කරන්නට භාර දී බුරුමය, ඉන්දියාව ආදී රටවල සංචාරයන්හි නිරත වී ඇත. මේ අවස්ථාවන් හි යහපත් මැදිහත්වීම් සිදු නොවීමෙන් දෙවතාවක දී ම ස්තූපයේ බැම් ගලවා නැවත සකස් කිරීමට සිදු වූ බවත්, 1910 කාලයේ ස්තූපයේ වැඩ කටයුතු සිංහල දක්ෂ ශිල්පීන්ට භාර දීමෙන් ඉතා හොඳ මට්ටමේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් යන බවත් හරිස්චන්ද්‍රයන් පෙන්වා දෙයි (2001, 308-309).

නමුත්, 1911 වර්ෂයේ දී අනුරාධපුරයට ඇද හැළුණ ධාරාණිපාත වර්ෂාව හේතුවෙන් තිස් අට අවුරුද්දක් මුළුල්ලේ නාරංවිට සුමනසාර හිමියන්ගේ මූලිකත්ත්වයෙන් ද අනල්ප උත්සාහයෙන් ද සිදු කරගෙන ගිය රුවන්වැලි ස්තූපයේ සංරක්ෂණ කටයුතු ඇණහිටියා පමණක් නොව එතෙක් සියලු කටයුතු නිශ්ඵල ක්‍රියාවන් බවට ද පත් විය. ඒ වර්ෂාව හේතුවෙන් ප්‍රතිසංස්කරණය කරගෙන ගිය අලුත් බැම් සියල්ලක් ජලයට සේදී කඩාවැටීම හේතුවෙනි. මෙසේ රුපියල් විසි ලක්ෂයකට අධික මුදලක් හා වසර තිස් අටක ශ්‍රමයක් මෙම ස්වභාවික උපද්‍රවය හේතුවෙන් විනාශයට පත් වී ඇත. කෙසේ නමුත් නොපසුබටව කටයුතු කරන ලද රුවන්වැලි සෑ චෛත්‍ය වර්ධන සමාගම, ආයතනික ප්‍රතිසංවිධානයක් ද ඇති කර නව පිළිසකර කිරීම් සඳහා වූ වගකීම රන්සිරිනෙල් පේ්‍රරා කුමාරසිංහ වෛද්‍යාචාර්යතුමා වෙත පවරා තිබේ. නැවත වතාවක් ස්තූපයේ කටයුතු ආරම්භ කරන ලද්දේ ද පෙර පරිදි ම ශ්‍රී ලංකාවේ නන් දෙසින් එක් රැස් කර ගන්නා ලද ආධාර මුදල්වලිනි (අභයසුන්දර, 2013, 217).

රුවන්වැලි ස්තූපයේ තෙවැනි පේසාව නැවත ඉදි කිරීම 19වන සියවසේ අවසාන භාගයේ දී හා 20වන සියවසේ මුල් කාලයේ දී සිදුව තිබේ. ඒ බවට නිදර්ශන ලෙස පේසාව මත අල්ලා ඇති තඹ තහඩු, රිදී තහඩු හා කුඩා ගල් පුවරු පෙන්වා දිය හැකි ය. මේවායෙහි 1879-06-13, බු.ව. 2455 (ක්‍රි.ව. 1912), 1914, බු.ව. 2458 (1915) ආදී වර්ෂ හා දිනයන් ද සඳහන් කර තිබේ (හෙට්ටිආරච්චි, 2009, 55).

නාරංවිට සුමනසාර හිමියන්ගේ මහත් පරිශ්‍රමයෙන් ආරම්භ කරන ලද රුවන්වැලි ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය අවසන් වන්නේ 1940 තරම් කාලයේ දී ය. ඒ අනුව සුමනසාර හිමියන්ගෙන් අනතුරුව එම කටයුතු සිදු කිරීමේ වගකීම පැවරුනේ 'රුවන්වැලි චෛත්‍ය වර්ධන සමිතිය' වෙත ය. 1902 වර්ෂයේ දී ඔවුන් නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි වී එම කටයුතු භාර ගෙන තිබේ. ප්‍රතිසංස්කරණ කටයුතුවල දී ගඩොල් බැඳීම සඳහා ප්‍රධාන වශයෙන් යොදාගෙන ඇත්තේ යුරෝපයෙන් ගෙන්වන ලද සිමෙන්ති ය. මේ හැරෙන්නට හුණු බදාම ද භාවිත කර තිබේ. බොහෝ දුරට ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදවාගෙන ඇත්තේ ද්‍රවිඩ කම්කරුවන් ය (එම., 217; නිශාන්ති, 2001, 2).

1940 ජූනි මස 17වන[28] දින අමරපුර නිකායික භික්ෂූන්වහන්සේලාගේ මැදිහත් වීමෙන් බුරුමයෙන් ගෙන්වන ලද පළිඟුවකින් කොත පළඳවා ස්තූපය පිළිසකර කිරීමේ කටයුතු නිළ වශයෙන් අවසන් කර ඇත. මෙම උත්සව අවස්ථාව සඳහා එවක ස්වදේශ කටයුතු භාර අමාත්‍ය ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, ඩී.ඇස්. සේනානායක, ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් හා ලක්ෂ පහකට අධික බැතිමත් ජනකායක් සහභාගී වී තිබේ (එම., 54; අභයසුන්දර, 2013, 218; කුලතුංග, 2001, 41-42; වත්තල, 1998, 16).

1932-56 කාලසීමාවේ දී රුවන්වැලි ස්තූපයේ කටයුතුවල දී රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණ සමිතිය මගින් කරගෙන ගොස් ඇත. මෙම කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යම් සහයෝගයක් ද ලබා දී තිබේ. මේ කාලසීමාවේ දී ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා රුවන්වැලි ස්තූපය සම්බන්ධ පරණ සිද්ධස්ථාන භාර උපදේශක මණ්ඩලයේ අනුකාරක සභාවක් ද සිට ඇත. රුවන්වැලි ස්තූපයට අදාළ කටයුතු අතර ඇත් පවුර ඉදි කිරීම් අවශ්‍යතාව මත කැණීම් කටයුතු සිදු කිරීම ප්‍රධාන කාරණයක් වී ඇති අතර, මෙහි දී කුඩා ප්‍රමාණයේ පුරාවස්තු රැසක්ම හමු වී තිබේ (පරණවිතාන, 2003, 55-56).

[28] ප්‍රණීත් අභයසුන්දර විසින් සඳහන් කරන්නේ මෙය 1940 ජනවාරි 25 දින බවයි.

1945 වර්ෂයේ කැණීම් සිදු කරන ලද දකුණු වාහල්කඩ 1946 මාර්තු අග දී ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සමිතිය විසින් අරඹා ඇත (නිශාන්ති, 2001, 4). මේ අවස්ථාව වන විට පොළොව මට්ටමේ සිට අඩි 10-12ක් තරම් උසට හොඳින් ආරක්‍ෂා වී තිබූ පැරණි ගල් කුට්ටි සම්පූර්ණයෙන්ම ඉවත් කොට දකුණු වාහල්කඩ නැවත ඉදිකිරීමට සමිතිය තීරණය කර තිබුනි. මේ කටයුතුවල දී පැරණි බදාම පිළිබඳ හොඳ අවධානයක් යොමු කර, නව ඉදිකිරීම්වල දී ඒ පැරණි ප්‍රමිතියට වඩාත් ආසන්න අයුරින් බදාම පිළියෙල කර ගැනීම අවශ්‍ය වුවත් පරණවිතානයන් පෙන්වා දෙන ආකාරයට උක්ත සමිතියෙහි එබඳු කාර්මික දක්‍ෂතා සහිත පුද්ගලයන් නොවීය (පරණවිතාන, 2003, 56). මේ තත්ත්වය හමුවේ වුව ද වාහල්කඩෙහි ගල් ඉවත් කිරීම අරඹා තිබේ. නමුත් හමුවන පුරාවිද්‍යාත්මක සාධක නිරීක්‍ෂණය කිරීමේ හෝ වාර්තාගත කිරීමේ ක්‍රමයක් හෝ ඔවුන් විසින් අනුගමනය කර නොමැති බවත්, මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දන්වා නොමැති බවත් පරණවිතානයන් පෙන්වා දෙයි (එම, 56). කැණීම් කටයුතු ආරම්භ කිරීමෙන් දින කිහිපයක දී විවිධ පුරාවස්තු හමු වීමෙන් ඒවා පිළිබඳ කටකතා පැතිර යාමත්, අවසානයේ පුවත්පත්වල මේ පුවත පල වීමත් සමග පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ කන වැකුණි. කෙසේ නමුත්, හැකි ඉක්මනින් පරණවිතාන මහතා එම ස්ථානයට ගොස් අදාළ වස්තු පිළිබඳ ලේඛනයක් සකස් කළත්, ගල් ඉවත් කිරීමේ පුරාවිද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කිරීමටත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු සිදු කිරීමටත් සමිතිය එකඟ කරවා ගැනීමට නොහැකි විය. නමුත් පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් ම නිකුත් කරන ලද පුරාවස්තු ආඥා පනතෙහි දෙවන කොටසෙහි හය වන වගන්තිය[29] ප්‍රකාරව මෙය වරදකි. නමුත් පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ පැහැදිලි කිරීම්වලින් පිළිබිඹු වන්නේ මෙබඳු කාරණා පාලනය කිරීම වඩාත් සංයමයෙන් කළ යුත්තක් බවයි. එයින් පැහැදිලි වන්නේ පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් වඩාත් නම්‍යශීලී අයුරින් පුරාවිද්‍යා උරුමය සම්බන්ධයෙන් මහජනතාව සමග ගනුදෙනු කළ බවකි[30].

---

[29] මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරීය යටතේ හැර, තමන්ට අයිති ඉඩමක හෝ අන් අයකුට අයිති ඉඩමක පුරාවස්තු සොයා ගැනීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින් කැණීම් නොකළ යුතු ය.

[30] පරණවිතාන මහතාට ප්‍රථමයෙන් පුරාවිද්‍යා සමීක්‍ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු කරන ලද්දේ බ්‍රිතාන්‍ය ජාතිකයින් ය. ඔවුන්ගෙන් මුල් ම නිළධාරීන් වූ බෙල් මහතා වැන්නවුන් බෞද්ධ හිතෛෂී කාර්යයභාරයක් ක්‍රියාත්මක කළ බවක් හඳුනා ගත නොහැක. වරෙක බෙල් මහතා විසින් අනුරාධපුරයේ පුරාවිද්‍යා කටයුතු සිදු කිරීමේ දී බෞද්ධ ස්මාරකවලට සිදු වූ හානි පිළිබඳව නීතියේ පිළිසරණ පැතීමට පවා සිංහලයින් කටයුතු කිරීමෙන් ඒ බව වඩාත් පැහැදිලි වෙයි. එහි දී ද ගැටුම සමනය නොවූ අතර, එම පුරාවිද්‍යා කටයුතු සිදු කළ ඉඩම් රජය සන්තක දේපල විනා බෞද්ධයන්ට නීතිමය අවසරයක් නොමැති බවට බෙල් තර්ක කර තිබේ (අභයසුන්දර, 2013, 76). එතෙක් දේශීය බෞද්ධ ජනතාව විසින් හැකි පමණින් සුරක්‍ෂිත කර

කවර ලෙසකින් හෝ මේ සමය වන විටත් මෙරට වටිනා පුරාවිද්‍යාත්මක සාධක විනාශ වෙමින් පවත්නා බවත්, නීති මගින්ම ඒවා වැළැක්වීම කළ හැක්කක් නොවන බවත් පරණවිතාන මහතා පෙන්වා දී තිබේ. එය තවරදුරටත් විස්තර කරන ඒ මහතා,

> ''නීතිය කොතරම් දැඩි වුවත් ඓතිහාසික සිද්ධස්ථානයක ඇති කලාත්මක නිර්මාණ ආරක්ෂා කිරීම පුරාවිද්‍යාඥයාගේ මෙන්ම හැම බෞද්ධයකුගේ ම යුතුකමක් බව බෞද්ධයන්ට අවබෝධ වන තුරු රුවන්වැලි සෑය වැනි ස්ථානවල ඇති ඓතිහාසික නෂ්ටාවශේෂ ආරක්ෂා කිරීම කළ හැකි දෙයක් නොවේ. පුරාතන සිද්ධස්ථානවල නඩත්තුව භාරව සිටින ප්‍රධාන පෙලේ දායකකාරකාදීන්ට මෙම කරුණු පහදා දීමට දෙපාර්තමේන්තුව හැකි සෑම උත්සාහයක් ම ගෙන ඇත'' යනුවෙන් පෙන්වා දෙයි (පරණවිතාන, 2003, 58).

මේ සමය වන විට රුවන්වැලි ස්තූපයේ නැගෙනහිර හා බටහිර වාහල්කඩ දෙක විශේෂ අවධානයකින් තොරව නටබුන්ව පැවති ස්වරූපයෙන්ම පවත්නා බවත්, උතුරු වාහල්කඩ බොහෝ කලකට පෙර දී ම විනාශයට පත් වූ බවත් ඔහු විසින් වාර්තා කරයි (පරණවිතාන, 2003, 59).

කෙසේ නමුත් ස්තූපයේ දකුණු ආයකය නැවත ඉදිකිරීම සඳහා සුබ දිනයක් හා වෙලාවක් නීර්ණය කර සම්භාවනීය අමුත්තන් කිහිපදෙනෙකුටම ආරාධනා කර ඇති හෙයින් කඩිනමින් ගල් ගැලවීමේ කාර්යය සිදු කළ යුතු බව කැණීම්කරුවන් විසින් පෙන්වා දී තිබේ. පරණවිතානයන් පෙන්වා දෙන ආකාරයට මේ කාලසීමාව වන විටත්, පැරණි ස්මාරක සම්බන්ධයෙන් පවත්නා පුරාවිද්‍යාත්මක වටිනාකම් පිළිබඳව සෙසු ප්‍රජාව (විශේෂයෙන් මෙම සමිතිය) විසින් අවබෝධ කරගෙන තිබුනේ අවම වශයෙනි (එම, 57).

1947 දී උතුරු හා නැගෙනහිර ආයක සංරක්ෂණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, පසුව දකුණු ආයකය සම්බන්ධයෙන් ද මැදිහත් වී තිබේ. උතුරු දකුණු හා නැගෙනහිර යන ආයක තුනම සම්බන්ධයෙන් මැදිහත් වීම් සිදු කරන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවකාශ නොලැබුන නමුත් එම කාර්යයන් සිදු කළ යුතු වූ සැළසුම් සකස් කර දීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කොට තිබේ (විජේපාල, 1990, 150). නමුත් පුරාවිද්‍යාත්මක නිර්ණායකයන්ට අනුව නිසි පුරාවිද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් සංරක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට රුවන්වැලි ස්තූපයේ

---

ගත් අතීත උරුමය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ පැවති නොරුස්නා ස්වභාවයක් ද මෙයින් ප්‍රකාශ වෙයි.

බටහිර ආයකය පමණක් හිමි විය. අනෙක් ආයක තුනෙහිම ලීස්තර මාරු කර ඇති බවත්, ආයක මුදුනේ පැවති සිංහ, අශ්ව, හස්ති හා ගව රූප පුරාවිද්‍යාත්මක මූලධර්මවලින් පරිබාහිර මැදිහත්වීම් හමුවේ ඉවත් කර ඇති බවත් පැවසේ. 1951 වර්ෂයේ පුරාවිද්‍යා වාර්තාවේ ද රුවන්වැලි ස්තූපයේ ආයක සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට පිටස්තර පුද්ගලයන්ගේ අවධානය යොමු වීම් පහත පරිදි ප්‍රතික්ෂේපිත වාක්‍යයකින් සටහන් කර තිබේ.

> ''එබඳු කටයුතු දෙපාර්තමේන්තුව මගින් ඍජු සුපරීක්ෂාව යටතේ සිදු නොකරන්නේ නම් කාර්මික කරුණු සම්බන්ධයෙන් අපගේ උපදෙස් නිසියාකාර ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න ගැන විස්වාසය තැබීම අපහසුය'' (පු.වි.පා.වා.[31], 1951).

මේ හැරෙන්නට මේ කාලසීමාවේ දී මහනුවර අළුත්මාලිගාවේ ඉදිකිරීම් කටයුතුවල නිරතව සිටි දකුණු ඉන්දියානු වඩු කාර්මිකයන් ලවා සංරක්ෂණය සඳහා යොදා ගන්නා ලද සියළු පාෂාණ ඔපමට්ටම් කර ඇති බව ද, බටහිර ආයකයේ පමණක් එසේ නොවන පැරණි පාෂාණ යොදාගෙන ඇති බව ද (නිශාන්ති, 2001, 4) අනාවරණය වීමෙන් පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ඉහත අවිශ්වාසය සාධාරණ බව පසක් වේ.

රුවන්වැලි ස්තූපයේ හතරැස් කොටුව, දේවතා කොටුව හා කොත්කැරැල්ල යන සියලු අනු කොටස්වල කටයුතු ද රුවන්වැලි චෛත්‍ය වර්ධන සමාගම විසින් 1940 කාලය වන විට සිදු කොට හමාර කරයි. මෙම මැදිහත්වීම්වල දී ඒ එකිනෙකක උස මට්ටම් ගර්භයේ විශ්කම්භයට සාපේක්ෂව තීරණය කර තිබේ (නිශාන්ති, 2001, 3). රුවන්වැලි ස්තූපයේ තුන්වෙනි පේසාව මුදුනේ මීටර් තුනෙන් තුනට පරතරයකින් යුතුව පැවති ශිලාමය ඇත් හිස් රූ 133ක් ඉතා මෑත අවධිය වනතෙක් ම පැවතී තිබේ. මේවා ස්මිදර් මහතාගේ සැළසුම්වල ද දැක ගත හැකි ය (Smither, 1993, 36, Plate XXVII). නමුත් පසු කාලීන මැදිහත්වීම් හමුවේ මෙම ඇත් හිස් රූ පේසාවෙන් ඉවත් වී තිබේ. නමුත් ජේතවනය හා අභයගිරිය යන ස්තූපයන් හි මෙම රූප සහිතව මැදිහත්වීම් සිදු කොට ඇත (කුලතුංග, 2001, 34; නිශාන්ති, 2001, 3).

1962 වර්ෂයේ දී රුවන්වැලි සෑය අබියසින් ලැබෙන පුරාවස්තු තැන්පත් කිරීම සඳහා 'නාරංවිට සුමනසාර සෙල් කැටයම් පුරාවිදු ගෙය' නමින් ස්ථානීය කෞතුකාගාරයක්' ඉදි කිරීම කෙරෙහි යොමු වන අතර, එවක සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍ය මෛත්‍රීපාල සේනානායක මහතා විසින් එය විවෘත කර තිබේ (විජේපාල, 1990, 138).

---

[31] පුරාවිද්‍යා පාලන වාර්තා යන්න කෙටියෙන් දක්වා ඇත

රුවන්වැලි ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව එම පරිශ්‍රයේ සෙසු ස්මාරක සම්බන්ධයෙන් මැදිහත් වීම කෙරෙහි ද අවධානය යොමු වී තිබේ. ඒ අනුව, සලපතළ මළුවේ සිව්කොණ පරිවාර දාගැබ් ආසන්නයේ ගල් ඇතිරවීම 1969 කාලයේ දී සිදුව තිබේ. 1967-68 කාලයේ කැණීම්තුලින් මතු කර ගන්නා ලද බටහිර දොරටුවේ වැලි මළුව දක්වා වූ ද්වාර මණ්ඩපය (පු.වි.පා.වා., 1967-68, G16) තහවුරු කිරීමේ කටයුතු ද මේ සමයේ සිදුව ඇත (පු.වි.පා.වා., 1970-77, 22). එසේ ගිණිකොණ දීඝ දාගැබ ආසන්නයේ ගල් ඇතිරවීම 1969-01-13 වැනි දින සිට 19 දින දක්වා පොතුහැර දායක පිරිසක් විසින් ශ්‍රමදානයකින් සිදු කළ බවට සිමෙන්ති බදාමය මත වූ සටහන් මගින් තහවුරු කරයි (හෙට්ටිආරච්චි, 2009, 55). 1969 පෙබරවාරි මාසයේ පල්ලේගම, කුඩා පල්ලේගම, උඩගම ආදී ප්‍රදේශවලින් පැමිණි දායක පිරිස් විසින් නිරිත්දිග කුඩා දාගැබ අසළ ගල් ඇතිරවීම කර තිබේ (එම:55). සලපතල මළුවේ ඉතිරිව තිබූ නටබුන් සාධක ගුරු කොට ගනිමින් රුවන්වැලි ස්තූපයට පරිබාහිරව සිව් කොණ පැවති ස්තූප ද පිළිසකර කරවා ඒවායෙහිත් කොත් පැළඳවීම 1970 වර්ෂයේ දී **හල්මිල්ලෑවේ සිරි සුමන රේවත** නාහිමියන් විසින් සිදු කර ඇත (එම., 55; වත්තල, 1998, 16).

මේ හැරෙන්නට සලපතල මළුව හා වැලි මළුව වෙන්වන සීමාවේ ඇත් ප්‍රාකාරයෙහි (හස්ථි ප්‍රාකාරය) වූ ඇත් රූප ප්‍රතිසංස්කරණය සඳහා යොමු වන්නේ 1945 දී ය. කොට පැරණි ඇත් පවුරේ ස්වභාවය පෙන්වීම සඳහා කොටසක් පැරණි ආකාරයෙන්ම ඉතිරි කර තිබේ. වර්තමානයේ දීත් මේ කොටස රුවන්වැලි ස්තූපයේ බටහිර දොරටුව ආසන්නයේ ඊට වම්පසින් දැක ගත හැකිය. මෙම පැරණි ඇත් රූප නිර්මාණය කිරීමට පෙර අවධියේ සත්ත්ව රූ රහිතව බොරදම් ගඩොලින් තැනූ ඉතා පැරණි ප්‍රාකාරය නිර්මාණය කර පැවති ආකාරය නිරූපණය කරන ශේෂයන් ද මේ කොටසෙහි වෙයි (කුලතුංග, 2001, 34-35; වත්තල, 1998, 16; නිශාන්ති, 2001, 3).

රුවන්වැලි ස්තූප ප්‍රතිසංස්කරණ කටයුතුවල දී අනුගමනය කරන ලද තාක්ෂණික විධික්‍රම එහි ගුණාත්මක ප්‍රතිඵලයන් පිළිබිඹු කිරීම සඳහා හේතු වූ බව පර්යේෂකයින් විසින් පෙන්වා දෙයි.

- ගර්භ ප්‍රතිසංස්කරණ ආරම්භයේ සිට අවසානය වන තෙක්ම ජලය පිටවීම සඳහා සකස් කර ගන්නා ලද තව් වසා නොතිබීම. මෙය ප්‍රබල කාරණයක් වන්නේ ස්තූප ප්‍රතිසංස්කරණ කාර්යයේ දී ස්තූපය තුළට ඇතුළු වන සියලු ජලය මේ තව් හරහා පිටතට පැමිණෙන බැවිනි. පිළිසකර කිරීම් අවසානයේ සියලු තව් එකවර වසා දැමීමෙන් ජලය ඇතුලට හෝ පිටතට ගමන් නොකරයි. ලංකාවේ ප්‍රතිසංස්කරණයට භාජනය වූ පොළොන්නරු රංකොත් වෙහෙර හා තිස්සමහාරාමයේ ස්තූපය ආදිය පැළීම්වලට ලක් වූයේ මේ තත්ත්වය නිසි පරිදි පාලනය කර ගත නොහැකි වීමෙනි.

- ස්තූප උපරිභාගයට සාපේක්ෂව අපරිභාගයේ ගඩොල් ප්‍රමාණය වැඩි කිරීම හා පැරණි ගඩොල් සමග සම්බන්ධතාවක් ඇති කිරීම. ස්තූප ගරා වැටීමට ලක් වීමෙන් අනතුරුව කේතු ආකාරයට (ධාන්‍යාකාර) ඉතිරි වීමත්, උපරි භාගයේ බොහෝ ප්‍රමාණයක් නව ඉදිකිරීමේ ලෙස සකස් කිරීමට සිදු වීමත්, ඒ සඳහා අධික වශයෙන් ගඩොල් භාවිත කිරීමට සිදු වීමත් මත ස්තූපයක් ගරා වැටීමට වැඩි ඉඩකඩක් පවතී. ඉහත ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීමෙන් ස්තූපය ස්ථායී ලෙස පවත්වා ගැනීමට හැකි වී ඇත (නිශාන්ති, 2001, 3).

විශේෂයෙන් පිපිරුම් ආදිය ඉතාම අල්ප වීම සඳහා මේ තාක්ෂණික උපයෝජනයන් ප්‍රබල වශයෙන් බලපා තිබේ.

**03.3. මෑත කාලීන ඉතිහාසයේ තෘතීයික අවධිය (1980 න් පසු නූතන මෑත ඉතිහාසය) තුළ රුවන්වැලි මහා ස්තූපය සම්බන්ධයෙන් වූ පර්යේෂණ හා සංරක්ෂණ මැදිහත්වීම්**

යුනෙස්කෝ සංවිධානයේ ආධාර සහිතව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීමේ හා වැඩිදියුණු කිරීමේ කාර්යය ඒවායෙහි පැවැත්ම වෙනුවෙන් සේම අන්තර්ජාතික අවධානය දිනා ගැනීම වෙනුවෙන් ඉතා වැදගත් වන බව ආචාර්ය රෝලන්ඩ් සිල්වා වැනි පුරාවිද්‍යා නියුක්තිකයන් 1970 දශකයේ කල්පනා කරයි. අනතුරුව ඊට අනුව මෙහෙයවීම මත යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ වැඩපිළිවෙල 1980 දෙසැම්බර් 18 වන දින 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත යටතේ ශ්‍රී ලංකා ජනරජ පාර්ලිමේන්තුවේ සම්මත කර ගනී. මෙම අරමුදල පිහිටුවා ගැනීමේ එක් මූලික පරමාර්ථයක් වූයේ සංස්කෘතික ත්‍රිකෝණයට අදාළ මූල්‍යමය හා පරිපාලනමය කටයුතු ක්‍රමවත්ව සංවිධානය කර ගැනීමයි.

සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ මෙහෙයවීමෙන් අනුරාධපුරයෙහි දියත් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති තුනකි. ඒවා ජේතවන ව්‍යාපෘතිය (1981 මැයි), අභයගිරි ව්‍යාපෘතිය (1981 ඔක්තෝබර්) හා මහාවිහාර ව්‍යාපෘතිය වශයෙනි. මුල් දෙක ආරම්භ වී යම් කාලසීමාවක් ඉක්ම ගිය පසු (වර්ෂ 1999 දී) අනුරාධපුර මහාවිහාර ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල යන ආයතන දෙකෙහිම එකතුවෙන් ආරම්භ කරන්නට විය. රුවන්වැලි ස්තූපය කේන්ද්‍ර කර ගත් ග්‍රිඩ් සැළැස්මක් අනුව පුරාවිද්‍යාත්මක පර්යේෂණ හා සංරක්ෂණ කටයුතු දියත් කිරීම මෙහි ප්‍රධාන කටයුතු ලෙස පෙන්වා දෙන ලදි. මේ කාලසීමාව වන විට රුවන්වැලි ස්තූපය යම් නැවත ඉදිකිරීමේ කටයුතු අවසන් වී තිබුනත්, ස්තූපය හා ආශ්‍රිත පරිසරයේ නියමිත පර්යේෂණ ගණනාවන් දියත් කෙරුණි. මෙසේ 2000 වර්ෂයේ දී ස්තූපයේ

පරිවාර අංග ලෙස සෙල් මළුවෙන් පිටත පැවති ස්ථාන ගණනාවක කැණීම් පර්යේෂණ කටයුතු දියත් කෙරිණ. දකුණු පිට ප්‍රාකාරය, දකුණු ද්වාර මණ්ඩපය, උතුරු හා නැගෙනහිර පිට ප්‍රාකාර, වැලි මළුව (කුලතුංග, 2003, 6-14) මේ පර්යේෂණ අතර කැපීපෙනුනි. මේ කාලසීමාවේදීත් රුවන්වැලි ස්තූපයේ විවිධ කොටස් අලලා පර්යේෂණ දියත් කරන ලදි. මෙහි දී බිම් සැකැස්ම පිළිබඳ පර්යේෂණ, වැලි මළුව හා පිට ප්‍රාකාරය පිළිබඳ පර්යේෂණ වැදගත් තොරතුරු බොහොමයක් අනාවරණය කර ගන්නා ලද පර්යේෂණයන් ය (කුලතුංග හා මණ්ඩාවල, 2004, 1-9). මේ පර්යේෂණ තවදුරටත් දියත් කරමින් 2001 වර්ෂයේ මුල් සමාසිකයේ රුවන්වැලි සෑ පිට ප්‍රාකාරයේ ද පර්යේෂණ දියත් කර තිබේ (කුලතුංග හා මණ්ඩාවල, 2006, 1-19).

මහාවිහාර ව්‍යාපෘතියේ සංරක්ෂණ කටයුතු ආරම්භ කරන්නේ 2000 වර්ෂයේ දෙවන සමාසිකයේ ය. මෙම කාලසීමාවේ දී රුවන්වැලි සෑ බටහිර ආයකය සංරක්ෂණය කිරීමේ කටයුතු දියත් කරන ලද අතර, සලපතළ මළුවේ බටහිර පියගැටපෙළ එම සංරක්ෂණ කටයුතු අතර ප්‍රධාන වී තිබුනි (එම., 14). බටහිර ආයකය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත්තේ ස්තූප ගර්භයේ බටහිරින් සිරස් පිපුරුමක් දැක ගත හැකිව පැවති බැවිනි. එය ගර්භයෙන් පටන්ගෙන පේසා වළලු හා බටහිර ආයකය දක්වා ද ව්‍යාප්ත වී ඇත. මේ පිපුරුම නිසා ඇද වැටීමට ආසන්නව පැවති ආයක කොටස ශක්තිමත් කිරීමේ පරමාර්ථයෙන් මැදිහත් වීම් සඳහා යොමු වී තිබේ. මේ කටයුතුවල දී අරමුණු කිහිපයක්ම ඉටු කර ගැනීමට ද යොමු වී ඇත. එසේ,

- ආයකයේ කුස්තුර තුළට මෑතකාලීන බදාම යොදා සිදු කළ මැදිහත්වීම්වල විධිමත් බවක් නොවූයෙන් බුරුල් වී ඇති ගල් හා ගඩොල් ගලවා ඉවත් කොට නැවත කුස්තුර අතරට බදාම යොදා ව්‍යුහමය ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම

- ආයකයට පිටුපසින් පවත්නා සුන්බුන් ඉවත් කිරීමෙන් අනතුරුව අනාවරණය වන ව්‍යුහමය කොටස් ශක්තිමත් කිරීම

- ආයකයෙන් ගැලවී ඇති කැටයම් ගල් අදාළ තැන්වලට නැවත සම්බන්ධ කිරීම

ඒවා අතරින් ප්‍රමුඛව කැපී පෙනෙයි (කුලතුංග සහ මණ්ඩාවල, 2004, 15-16). 1940 ගණන්වල දී රුවන්වැලි ස්තූපයේ සංරක්ෂණ මැදිහත්වීම්වලට ලක් නොවූ බටහිර වැලි මළුවේ සිට සෙල් මළුවට පිවිසීම සඳහා වූ පියගැටපෙළ සංරක්ෂණය කෙරෙහි ද මෙහි දී අවධානය යොමු වී ඇත (එම., 16-18). 2001 වර්ෂයේ මුල් සමාසිකයේ දී සංරක්ෂණ කටයුතුවල දී ප්‍රමුඛ අවධානය යොමු වී

ඇත්තේ ස්තූපයේ පිටත ප්‍රාකාරයේ බිත්ති සංරක්ෂණය කිරීම කෙරෙහි ය (කුලතුංග සහ මණ්ඩාවල, 2006, 63-77).

**සාරාංශය**

මෙම විමර්ශනයේ දී අනුරාධපුරයේ මහා ස්තූප අතරින් පූජනීයත්වයෙන් අග්‍ර ස්තූපය ලෙස නම් දරන රුවන්වැලි ස්තූපය ඉදිකිරීම හා ඉන් අනතුරුව සමයේ ආරක්ෂාව හා පැවැත්ම සම්බන්ධයෙන් මැදිහත් වීමේ විවිධ අවස්ථා පිළිබඳව සාකච්ඡා කරන ලදි. එහිදී **ඈතකාලීන ඉතිහාසය, මධ්‍යකාලීන ඉතිහාසය** හා **මෑත මෑතකාලීන ඉතිහාසය** යනුවෙන් ප්‍රධාන යුග තුනක් ඔස්සේ සමස්ත තොරතුරු විශ්ලේෂණයට භාජනය විය. ඈත කාලීන ඉතිහාසයේ දී රුවන්වැලි ස්තූපය ඉදිකිරීමේ මුල් පියවර හා අනුරාධපුර අවධියේ දී විවිධ පාලකයන්ගේ මැදිහත් වීමෙන් එහි මැදිහත් වීම් සිදු වූ ආකාරය විමර්ශනය විය. මධ්‍යකාලීන අවධියේ දී විධිමත් මැදිහත් වීමක් සිදු නොවූ විටින් විට සුලු ප්‍රමාණයේ මැදිහත් වීම් සිදුවූ කාල පරිච්ඡේදයක් ලෙස විද්‍යමාන විය. අවසානයේ එහි මෑතකාලීන ඉතිහාසය යන්න (I) මෑතකාලීන ඉතිහාසයේ ප්‍රාරම්භක අවධිය හෙවත් මුල් මෑත ඉතිහාසය, (II) මෑතකාලීන ඉතිහාසයේ ද්විතීයික අවධිය හෙවත් මධ්‍ය මෑත ඉතිහාසය හා (III) මෑත කාලීන ඉතිහාසයේ තෘතීයික අවධිය හෙවත් නූතන මෑත ඉතිහාසය යන කාල වකවාණු තුලදී හඳුනා ගන්නා ලද තොරතුරු ඉදිරිපත් කරන ලදි. රුවන්වැලි ස්තූපය බඳු විශාල ඉන්ජිනේරුමය ගුණ සහිත වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සම්බන්ධයෙන් මැදිහත් වීමක් සිදු වූයේ නම්, එය සිදු වූයේ රටේ පාලකයාගේ මූලිකත්වයෙන් හෝ විදේශීය සහයෝගයෙනි. එසේ නොවන එකම යොමු වීම නාරංවිට සුමනසාර ස්වාමීන් වහන්සේගේ මැදිහත් වීමයි. ඒ සඳහා ශ්‍රීමත් වලිසිංහ හරිස්චන්ද්‍ර මහතාගෙන් ද අගනා සහයෝගයක් හිමි වූ බව සඳහන් විය. ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමයේ සළකුණක් බඳු රුවන්වැලි ස්තූපය සුරක්ෂිත කිරීමේ මාහැඟි කාර්යයභාරය වෙනුවෙන් බෙහෙවින් කැපවූ එම දෙපළගේ කාර්යයභාරය කාලීන වශයෙන් අති මහත් බව කෘතඥපූර්වකව සිහිපත් කරමි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අභයසුන්දර, ප්‍රනීත්. (2013). *බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර විමර්ශනය*. සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, කොළඹ.

කරුණානන්ද, යූ.බී. (1993). අනුරාධපුරයේ පිබිදීම. *සංස්කෘතික පුරාණය*. බස්නායක, එච්.ටී. හා තිලකරත්න, මාපා. (සංස්.), 1 වෙළුම, 5 කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

කරුණානන්ද, යූ.බී. (2003). ***බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර සහ අනුරාධපුර බෞද්ධ ප්‍රබෝධය.*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

කරුණාරත්න, ඩබ්.ඇස්. (1990). ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ ඉතිහාසය (1890-1910). කුමාරසිරි, ප්‍රේමලාල්. (පරි.), ***පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය.*** නන්දදේව විජේසේකර (සංස්.), පළමුවන වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, 3-44 පිටු.

කුලතුංග, ටී.ජී. (2003). ***ද්විතීය වාර්තාව මහාවිහාර ව්‍යාපෘතිය 2000 ජනවාරි - 2000 ජූනි.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, කොළඹ.

කුලතුංග, ටී.ජී. (2001). ***අනුරපුර මහා විහාරය.*** කර්තෘ ප්‍රකාශන, මුද්‍රණය, තරංජී ප්‍රින්ටර්ස්, නාවින්න, මහරගම.

කුලතුංග, ටී.ජී. (2004). ***ලංකාවේ ස්තූපය.*** කර්තෘ ප්‍රකාශන, මුද්‍රණය, තරංජී ප්‍රින්ටර්ස්, නාවින්න, මහරගම.

කුලතුංග, ටී.ජී. (2014). ***පුරාණ අභයගිරි විහාරය.*** මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.

කුලතුංග, ටී.ජී. සහ මණ්ඩාවල, පී.බී. (2004). ***තෙවැනි වාර්තාව මහාවිහාර ව්‍යාපෘතිය 2000 ජූලි -2000 දෙසැම්බර්.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, කොළඹ.

කුලතුංග, ටී.ජී. සහ මණ්ඩාවල, පී.බී. (2006). ***හතරවැනි වාර්තාව මහාවිහාර ව්‍යාපෘතිය 2001 ජනවාරි -2001 දෙසැම්බර්.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, කොළඹ.

නිශාන්ති, එච්.එම්. ලක්මිණී, (2001). අනුරපුර රුවන්වැලි මහ සෑය ප්‍රතිසංස්කරණය. ***සංස්කෘතික පුරාණය.*** 3 කලාපය, ටී.ජී. කුලතුංග (සංස්.), 1-7 පිටු.

***දීපවංසය*** (1970). කිරිඇල්ලේ ඥාණවිමල හිමි (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

පරණවිතාන, එස්. 2003 (1972): ***පුරාවිද්‍යා පරියේසණ,*** විසිදුනු ප්‍රකාශන, බොරලැස්ගමුව.

පරණවිතාන, එස්. 2005 (1963). *ලංකාවේ ස්තූපය,* (පරි. ඇල්. ප්‍රේමතිලක) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පාකර්, හෙන්රි. (2008). *පුරාණ ලංකාව.* නිස්සංක පෙරේරා (පරි.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මහාවංශය (2006). නායක මාහිමි, ශ්‍රී සුමංගල. සහ දේවරක්ෂිත පඬිතුමන්, බටුවන්තුඩාවේ. (සිංහල පරි.), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10.

*වංසත්ථප්පකාසිනී* (1994). අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක (සංස්.), විද්‍යාලංකාර මුද්‍රණාලය, කැළණිය.

විජේපාල, ඩබ්.එච්. (1990). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය 1950 සිට 1970 දක්වා. *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය.* විජේසේකර, නන්දදේව. (සංස්.), පළමුවන වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, 127-165 පිටු.

සිල්වා, රෝලන්ඩ්. (1990). යුනෙස්කෝ - ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය. හේරත් එස්.බී. (පරි.), *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය.* විජේසේකර, නන්දදේව. (සංස්.), පළමුවන වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, 239-258 පිටු.

සිරිසෝම, එම්.එච්. (1993). *දාගැබ් පුරාණය.* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

හෙට්ටිආරච්චි, ඇස්.බී. (1990). පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම, එළි පෙහෙළි කිරීම, නඩත්තු කිරීම හා පරිසරය සැකසීම (1910-1930). *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය,* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

හෙට්ටිආරච්චි, කරුණාසේන. (2009). මූලාශ්‍ර හෙළිකරන අනුරපුර දාගැබ්, කර්තෘ ප්‍රකාශිත, මුද්‍රණය තරංජී ප්‍රින්ටර්ස්, මහරගම.

***Ephigraphia Zelanica*** (1985/1928). Wickramasinghe, Don Martino De Zilva. (ed. & Trans.), Vol.II, Archaeological Survey of Ceylon, Government of Ceylon by Humphrey Milford, Oxford University Press, Lodon.

Godakumbura, C.E. (1969). ***History of Archaeology in Ceylon.*** Journal of the Royal Asiatic Society (Ceylon Branch) New Series, Vol. XIII, Colombo, 1-38pp.

***Inscriptions of Ceylon (IC)***. (1983). S. Paranavitana, *Vol. II, Part I,* Department of Archaeology, Sri Lanka.

Paranavithana, S. (1946). ***Recent Archaeological Finds at Ruvanvali Dagaba***. JRAS (CB), Vol. XXXVII, No.101, Colombo, 3-7pp.

Smither, J.G. (1894 [1993]). ***ARCHITECTURAL REMAINS, ANURĀDHAPURA, SRI LANKA.*** Wikramagamage, Chandra. (Revised and Ed.), Academy of Sri Lankan Culture, F49, Mattegodagama, Polgasovita, Sri Lanka.